# ධමමනියාමතාවය - 28

පූජ්‍ය ඉලුකේගම අතථදස්සි සවාමීන් වහන්සේ.

# ධම්මනියාමතාවය - 28

**<u>පටිච්චසමුප්පාදය - අභිධම්මභාජනීය නය ක්‍රම වර්ණනාව</u>**

**<u>කුසල නිර්දේශ වර්ණනාව</u>**

**<u>(රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර සිත්.)</u>**

**<u>2022.03.12 දින දේශනාව.</u>**

සංවිධානය : සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා ගුවන් විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපය.

ධර්ම දේශනාවට Youtube ඔස්සේ සවන් දීම සඳහා

https://youtu.be/Ujt7wb7og3g

පූජ්‍ය ඉලුක්කේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ.

**ධර්ම දානය පිණිසයි.**

**පිටපත් කිරීම සහ සංස්කරණය:**

එච්.ඒ.අමරතුංග
(දුරකථනය 041 2240228)

**තාක්ෂණික දායකත්වය:**

චමිලා අමරතුංග

මෙම පොත නැවත මුද්‍රණය කර පිරිසිදු ධර්ම දානයක් වශයෙන් නොමිලයේ බෙදාහැරීමට කැමැති සැදැහැවතෙක් වේ නම් දුරකථනයෙන් සංස්කාරක අමතා ඒ සඳහා දේශකයන් වහන්සේගේ අවසරය ලබා ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා ගුවන් විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපයේ අනුග්‍රාහකත්වයෙන්

zoom තාක්ෂණය ඔස්සේ

අකුරැස්ස, ගල්ලල,

ඉදිගස්හේන ආරණ්‍ය සේනාසනාධිපති,

පූජ්‍ය ඉලුක්කේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ,

2022.03.12වැනි දින පවත්වන ලද

ධර්ම දේශනාව යි.

**පටිච්චසමුප්පාදය - අභිධම්මභාජනීය නය ක්‍රම වර්ණනාව**

**කුසල නිර්දේශ වර්ණනාව**

**(රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර සිත්.)**

යන්න අරමුණු කරන ලද

මෙම ධර්ම දේශනාව

ඉමහත් ශ්‍රද්ධාවෙන් සහ ඔබ සැම කෙරෙහි උපන් කරුණාවෙන් යුතුව හැකි තාක් දුරට උන්වහන්සේගේ දේශනා විලාසයෙන් ම ලිඛිත මාධ්‍යයෙන් සකස් කොට ඔබ අතට පිදීමකි.

සාකච්ඡාවක් ලිඛිත ව සකස් කිරීමේ දී, දේශනා විලාශය, වචන උච්චාරණ විලාශය, ශ්‍රවණ තත්ත්වය, කාර්මික තත්ත්වය, ආදී විවිධ ගැටලු හමුවන තැන් නිතිපතා විද්‍යමාන වේ.

කෙසේ වුව ද වර්තමානයෙහි බොහෝ දෙනා නිබඳ විමසන පටිච්චසමුප්පාදය පිළිබඳව වූ ක්‍රම වේදය ආ දී බුද්ධ දේශනාව අශ්‍රැතවත් හුදී ජනයාට පැහැදිලි කර දිමේ අරමුණෙන් අප ස්වාමිපාදයන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් කරන ලද මෙම දේශනය හොඳින් හදාරා පරිශීලනය කොට සමාධිමත් වීමේ උත්සාහය ගන්නා මෙන් ඔබ සැමගෙන් ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිමු.

"කුසල ධර්මයෝ ඒ කතා කරන ගමන්, අද දවසේ දී අපට සාකච්ඡා කරන්න තියෙන්නේ, **මහග්ගත කුසල්, අප්පමාන කුසල්** හෙවත් **රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර කුසල ධර්මයන්** පිළිබඳව යි.

මේ දේවල් සමාධියට වැදගත් කුසල ධර්මයෝ ටිකක්. නමුත් මේ වාගේ ඒ ධ්‍යාන, මාර්ග ඵල ලබන ආකාරය, මාර්ගයක් විස්තර කිරීමක් නෙවෙයි අපි මෙහි දී කරන්නේ. මේ **රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර** කියන කුසල ධර්මයන් වල ස්වභාවය පිළිබඳව හා ඒවා තුළ අපි දැන ගත යුතු විශේෂ කරුණු, ධර්මතා පිළිබඳව තමයි පැහැදිලි කරන්නේ.

ඉතින් ඒකෙන් අපි මේ ධර්මයේ හැසිරෙන බෞද්ධ පින්වතුන් වශයෙන් අපි මේ හැම දෙයක් ම දැන ගෙන සිටීම වටිනවා. මොකද, අපටත් යම් යම් අවස්ථාවල දහම් කරුණු ශ්‍රවණය කිරීමේ දී, ධර්ම දානය හා ධර්ම සාකච්ඡා වල දී මේ දේවල් නිරවුල් ව දැන ගෙන සිටීම, මේ බුද්ධ සාසනයේ උන්නතිය වෙනුවෙන් බොහෝ උපකාර වෙනවා.

ඉතින් ඒ නිසා, අද අපි කතා කරන **රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර කුසල්** පිළිබඳව කතා කිරීම, එහි විශේෂ තැන් මේවා පිළිබඳව **විභංග ප්‍රකරණයේ** වෙනත් තැන්වල, විශේෂයෙන් **ධම්මහදය විභංගය** වගේ විභංග වල කතා කරලා තියෙන, අපි දැන ගත යුතු විශේෂ කාරණා ගැන සාකච්ඡා කරලා, අපි **පටිච්චසමුප්පාදයේ** ඊට අදාල දහම් කාරණා පිළිබඳව සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා.

# ධම්මනියාමතාවය 28

## <u>පටිච්චසමුප්පාදය - අභිධම්මභාජනීය නය ක්‍රම වර්ණනාව</u>

## <u>කුසල නිර්දේශ වර්ණනාව</u>

## <u>(රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර සිත්.)</u>

## <u>2022.03.12 දින දේශනාව.</u>

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**
**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**
**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

හොඳයි, තෙරුවන් සරණයි, සම්මා සම්බුදු සරණයි සියලු දෙනාට ම. අදත් අපි පටිච්චසමුප්පාද දේශනා මාලාවේ, අභිධර්මභාජනීය සාකච්ඡා මාලාව ආරම්භ කරන්නටයි සූදානම් වෙන්නේ.

ඔබ දන්නවා ගිය වර දේශනාවේ අපි කතා කළේ, **කාමාවචර කුසල නිර්දේශ වර්ණනාව** පිළිබඳව යි. ගිය සැරේ, මම මතක් කළා කාමාවචර කුසල් කියන දේවල්, විශේෂයෙන් අපි දැන ගත යුතු වැදගත් ධර්ම කොට්ඨාසයක් බව. එයට හේතුව, නිවන් දකින තුරු මේ **කාමාවචර කුසල්** තමයි සත්ත්වයාට බොහෝ කාලයක්, හිත සුව පිණිස, නිවන පිණිස ම උපකාර වෙන්නේ.

ඒ නිසා, ඒ කුසල ධර්මයෝ ඒ කතා කරන ගමන්, අද දවසේ දී අපට සාකච්ඡා කරන්න තියෙන්නේ, **මහග්ගත කුසල්, අප්පමාන කුසල්** හෙවත් **රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර**

**කුසල ධර්මයන්** පිළිබඳව යි.

මේ දේවල් සමාධියට වැදගත් කුසල ධර්මයෝ ටිකක්. නමුත් මේ වාගේ ඒ ධ්‍යාන, මාර්ග ඵල ලබන ආකාරය, මාර්ගයක් විස්තර කිරීමක් නෙවෙයි අපි මෙහි දී කරන්නේ. මේ **රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර** කියන කුසල ධර්මයන් වල ස්වභාවය පිළිබඳව හා ඒවා තුළ අපි දැන ගත යුතු විශේෂ කරුණු, ධර්මතා පිළිබඳව තමයි පැහැදිලි කරන්නේ.

ඉතින් ඒකෙන් අපි මේ ධර්මයේ හැසිරෙන බෞද්ධ පින්වතුන් වශයෙන් අපි මේ හැම දෙයක් ම දැන ගෙන සිටීම වටිනවා. මොකද, අපටත් යම් යම් අවස්ථාවල දහම් කරුණු ශ්‍රවණය කිරීමේ දී, ධර්ම දානය හා ධර්ම සාකච්ඡාවල දී මේ දේවල් නිරවුල් ව දැන ගෙන සිටීම, මේ බුද්ධ සාසනයේ උන්නතිය වෙනුවෙන් බොහෝ උපකාර වෙනවා.

ඉතින් ඒ නිසා, අද අපි කතා කරන **රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර කුසල්** පිළිබඳව කතා කිරීම, එහි විශේෂ තැන් මේවා පිළිබඳව **විභංග ප්‍රකරණයේ** වෙනත් තැන්වල, විශේෂයෙන් **ධම්මහදය විභංගය** වගේ විභංග වල කතා කරලා තියෙන, අපි දැන ගත යුතු විශේෂ කාරණා ගැන සාකච්ඡා කරලා, අපි **පටිච්චසමුප්පාදයේ** ඊට අදාළ දහම් කාරණා පිළිබඳව සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා.

හොඳයි අපි දැන් මේ කතා කර ගෙන ආපු **කුසල නිර්දේශ වර්ණනාව** යටතේ, **කාමාවචර කුසල ධර්මයෝ**, අපි පසුගිය වාරයේ සම්පූර්ණයෙන්ම කතා කරලා අවසන් කළා. ඒ පිළිබඳව ගැටලු තියෙනවා නම් අපට සාකච්ඡාවේ දී කතා කරන්න පුළුවන්.

ඊට අනතුරුව, දැන් අපි මේ **රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර කුසල්** කතා කරන්න තියෙන්නේ.

ඊට අමතරව, විශේෂයෙන් අපි කාමාවචර කුසල්වල, තව තියෙනවා කොටස් දෙකක්, **කාමාවචර විපාක** සහ **කාමාවචර ක්‍රියා සිත්** කියලා. එතකොට මේ කාමාවචර කුසල් සිත් අට වාගේම යි, කාමාවචර විපාක සිතුත් අටක් තියෙනවා, කාමාවචර ක්‍රියා සිත් අටක් තියෙනවා.

එතකොට, ඒ කාමාවචර අපි කතා කරපු මේ කුසල සිත් අට ට අනුරූපව, ඒ කර්මයට අනුරූපව තමයි විපාක සිත් ලැබෙන්නේ. ඒ ඒ භූමියට අදාලව ඒ විපාක සිත් ටික අපට ලැබෙනවා. ඒක මෙලොව වශයෙන් දිට්ඨධම්මවේදනීය වශයෙන් ද, උපපජ්ජවේදනීය වශයෙන් ද, අපරාපරියවේදනීය වශයෙන් ද, විවිධාකාරයෙන් මේ කුසල විපාකයන්, ඒ කුසලයට අනුරූපව අපට හම්බ වෙනවා.

ඒ වාගේම, කාමාවචර ක්‍රියා සිත් ගත්තහම, කාමාවචර ක්‍රියා සිත් තියෙනවා ඔක්කෝම, සහේතුක කාමාවචර ක්‍රියා සිත් අටකුත්, අහේතුක කාමාවචර ක්‍රියා සිත් තුනකුත් තියෙනවා.

එතකොට ඒවායින් අද මේ දේශනාවට අදාළ වෙන්නේ, **කාමාවචර සහේතුක ක්‍රියා සිත් අට** යි. ඒ ක්‍රියා සිත් අටත්, අර වගේ ම, කාමාවචර කුසල සිත් වගේ ම, අටක් තිබෙනවා. ඒ විදියට ම යි ප්‍රභේද වෙන්නේ. නමුත් මේ ක්‍රියා සිත්වල වෙනස තමයි, කුසලත් නොවුනු, අකුසලත් නොවුනු, කර්ම විපාකත් නොවුනු සිත් කොටසක්. **නෙව කුසලං, නා අකුසලං, නච කම්මවිපාකං** කියලා තමයි, ඒ ක්‍රියා සිත විස්තර කරන්නේ.

කුසලත් නොවන, අකුසලත් නොවන, කර්ම විපාකත් නොවන, මේ සහේතුක ක්‍රියා සිත්, විශේෂයෙන් මහ රහතන්වහන්සේලාට, ඒ ඒ දිට්ඨධම්මවේදනීය සුඛ විහරණය සඳහා, ඒ ඒ ක්‍රියාවන් සිද්ධ කිරීම සඳහා, උපදවා ගන්න සිත් කොටසක්.

නමුත් මේ සිත්වල ස්වභාවය, ඒ සිත්වල තියෙන ධර්ම, හැම එකක් ම සමානයි. ඒ සාමාන්‍ය අපි කුසල සිතක් විස්තර කරපු ආකාරයට තමයි විස්තර කරන්නේ. **සොමනස්ස සහගතා, ඤාණසම්පයුක්තා**, කියලා තමයි විස්තර කරන්නේ.

හැබැයි, එහෙම විස්තර කරන කොට, **නෙව කුසල, නාඅකුසල, නච කම්මවිපාකං** කියලා පටන් ගන්නවා. වෙනස එච්චරයි. අනිත් ඔක්කෝම *සොමනස්ස උපේක්ෂා භේදය, ඤාණවිප්පයුත්ත සම්පයුත්ත භේදය, සසංකාර අසංකාර භේදය*, මේ ඔක්කෝම එක සමානයි.

ඒ නිසා, මම මෙතෙන්ට ඒ ටිකත් එකතු කරලා අවසන් කරන්න අදහස් කළා. ඒ වගේ වෙනසක් නැහැ. වෙනස අර කුසල් අකුසල් නො වන, ඒ රහතන්වහන්සේලාට සියලු කෙලෙස් ප්‍රහීණ කරපු රහතන්වහන්සේලාට, ලෝකයේ ජීවත් වීම සඳහා සහ, දිට්ඨධම්ම සුඛ විහරණය සඳහා පවතින සිත් කොටසක් කියන එකයි එහි අපි දැන ගත යුතු වන්නේ.

ඒ අනුව, පටිච්චසමුප්පාද ක්‍රියා දාමය ගත්තහම, ඒ පටිච්චසමුප්පාදය පටන් ගන්න කොට, පටන් ගැනීමේ දී ඒ දේවල් කුසලත් නොවන, අකුසලත් නොවන නිසා, ඒ දේවල් අර **කුසලමූලපච්චයා**, **අවිජ්ජාපච්චයා සඞ්ඛාරා,** කියලා පටන් ගන්නේ නැතුව, ඒ සිත් හැම වෙලාවේ ම පටන් ගන්නේ, **සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං** කියලා.

කුසල් සිත් පටන් ගත්තේ **කුසලමූලපච්චයා සඞ්ඛාරා** කියලා. නමුත් මේ කියන **ක්‍රියා සිත්** පටන් ගන්නේ, **සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං** කියලා තමයි පටන් ගන්නේ. ඒ හැර, ඊට යට තියෙන ඒ නය ක්‍රම එකක් වත් වෙනස් වෙන්නේ නැහැ. ඒ දේවල් ඒ විදියට ම පවතිනවා.

ඒ න්‍යායයන් හතර හා ඒ දේවල් අපට හම්බ වෙන විශේෂ

තැන්, අර වෙදනා ස්ථානයෙන් පස්සේ එන **වෙදනාපච්චයා තණ්හා** කියන තැන්වල, **වෙදනාපච්චයා පසාදො, පසාදපච්චයා අධිමොක්ඛො** කියලා, අර ***තණ්හාව උපාදානය*** කියන තැන් පුරවන්නේ, ***ප්‍රසාදය*** හා ***අධිමොක්ඛය*** කියලා, අර කුසල් සිත්වල වාගේම.

ඒ නිසා, ඒ දේවල් වලත්, ඒ නය ක්‍රම ඒ විදියට ම ලැබෙනවා. මේ ***ක්‍රියා සිත්*** හා ***විපාක සිත්වල.***

ඒක තමයි, කාමාවචර කුසල විපාක, ක්‍රියා කියන සිත් විසිහතරක් තියෙනවා. මේ සිත් විසිහතරේ ස්වභාවය මේ සාමාන්‍ය පටිච්චසමුප්පාදය මේ ***අභිධම්මභාජනීය*** ධර්ම ග්‍රන්ථයේ, මේ දේවල් කොටස් වලට කඩලා, පසුව තමයි විස්තර කරන්නේ.

නමුත් පසුව විස්තර කළත්, ඒවා පෙයයාලම් ක්‍රමයට, මේ ආකාරයෙන් ම විස්තර කළ නිසා, මම මෙතෙන්ට මේ ටික ඇතුළත් කරලා, කතා කරන්න යෙදුණේ හැමෝටම පහසු නිසා. ඒ වගේ විශේෂතා තැන් තියෙනවා නම් අපට සාකච්ඡාවේදිත් මතු කර ගන්න පුළුවන්.

ඊළඟට අපට කතා කරන්න තියෙන, මේ ***රූපාවචර, අරූපාවචර සිත්*** පිළිබඳව අපි අද අවධානයට යොමු වෙමු.

එතකොට රූපාවචර කුසල් සිත් පටන් ගන්නේ, **කුසල ධර්මයෝ කවරහ යත්: යම් කලෙක, රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩාද, කාමයන්ගෙන් වෙන්වම, අකුසල ධර්මයන්ගෙන් වෙන්වම,** ***සවිතක්කං සවිචාරං විවෙකජං ප්‍රීති සුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති*** කියලා තමයි පාලියේ තියෙන්නේ, ඒ අදාළ ධ්‍යානයත් එක්ක, **පඨවි කසිනං** කියලා තියෙන්නේ. එතකොට මේකේ අර පෙයයාලම් ක්‍රමය යි තියෙන්නේ ඔය ධ්‍යාන පිළිබඳව. ඒ වාක්‍යය බොහෝ තැන්වල

සඳහන් වෙලා තියෙන නිසා. එතකොට මේ ආධුනික අයත් ඉන්න නිසා අපි මේ රූපාවචර කුසල් සිත් කියන දේවල්, ඒ දේවල් කාම ලෝකයේ, රූපාවචර ලෝකයේ හැම එකකම පහල වෙන්න පුළුවන්. හැබැයි, විපාක සිත් පහල වෙන්නේ, රූපාවචර භූමියේ විතරයි. කාම භූමියේ රූපාවචර කුසල් සිත් පහල වෙන්නේ නැහැ.

එතකොට මේ කාමාවචර කුසල් සිත් අපි කාමාශාව යටපත් කර ගෙන, ඒ සම්බන්ධව තියෙන නීවරණ ධර්මයන් යටපත් කර ගැනීමෙන්, සමථ විදර්ශනාව තුළින්, මේ ධ්‍යාන ලබාගන්න පුළුවන්. ඔබ දන්නවා, මේ ධ්‍යාන, රූපාවචර කුසල ධ්‍යාන, නය ක්‍රම දෙකකට තියෙනවා, **චතුක්ක නය ක්‍රම සහ පඤ්චක නය** කියලා.

එහෙම නය ක්‍රම දෙකක් තියෙන්න හේතුව තමයි, මේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ ස්වභාවය නිසා. දැන් මේ ධ්‍යාන සිත්, පළවෙනි එක ආරම්මණයෙන් අපි අරමුණක් සමථ කර්මස්ථානයක පිහිටුවා ගෙන තමයි මේ ධ්‍යාන උපදවා ගන්නේ. අර විදර්ශනා කරනවා හා සමාන සිත් නෙවෙයි මේවා.

ඒ විදර්ශනා සිත්වල අපි කරන්නේ, ඒ ඒ ධර්මයන්ගේ පරමාර්ථ ධර්මයන් අපි අරමුණු කරමින්, ඒවාගේ යථා ස්වභාවික ලක්ෂණ, සාමාන්‍ය ලක්ෂණ හෙවත්, **අනිත්‍ය දුක්ඛ අනාත්ම** ආදී මේ දේවල් ඒ පරමාර්ථ ස්වභාවයන් නුවණින් විමසා බැලීමයි.

නමුත් මේ **රූපාවචර ධ්‍යාන** හැම එකකට ම අරමුණ, සම්මුතිය යි. පඤ්ඤප්තියක් තමයි අරමුණු වෙලා තියෙන්නේ, පරමාර්ථ ධර්මයෝ නෙවෙයි. ඒ නිසා, සමථ කමටහන් හැටියට අපට පෙන්වලා තියෙන ඒ කර්මස්ථාන මේ බුද්ධ සාසනයේ, දස කසින, දස අසුභ, ආනාපාන සති, ආදී මේ කර්මස්ථාන වලින් එකක් අරමුණු කර ගෙන තමයි, මේ ධ්‍යාන උපදවා ගන්නේ. එතකොට ඒ ධ්‍යාන උපදවා ගන්න විදිය හා ඒ සමථය අපි

කොහොමද සිද්ධ කරන්නේ කියන එක පිළිබඳව මේ හැමෝම යම් ආකාරයකින් දන්නවා.

එතකොට මේ ධ්‍යාන සිත් තමයි විස්තර කරන්නේ. එතකොට මේ ධ්‍යාන සිතක් උපදින්නේ කොහොමද කියලා විස්තර කරන්නේ. එතකොට මේ ධ්‍යානයක ආරම්මණය මෙතන පෙන්වලා තියෙන්නේ, දස කසිනයන්ගෙන් එකක්, **පඨවි කසිනය** කියලා.

එතකොට එක කසින අරමුණක් අර ගෙන, ඒ කසිනාරම්මණයම අරගනිමින්, වෙන අරමුණු සිතට එන්න නො දී, ඒ අනුව නිරන්තරයෙන් හිත පැවැත්වීමෙන් තමයි මේ ධ්‍යාන ලබාගන්නේ. ඒවා, ***උග්ගහ නිමිත්ත, පටිභාග නිමිත්ත, උපචාර නිමිත්ත, අර්පනා නිමිත්ත*** කියලා පිළිවෙළට යන්නේ.

**උග්ගහ නිමිත්ත** :- එතකොට අපි ආනාපානසතිය වගේ කමටහනක් ගත්තොත් සමථය හැටියට, ආශ්වාස ප්‍රශ්වාස තමයි අරමුණු වෙන්නේ. එය හොඳට ආශ්වාස ප්‍රශ්වාස ප්‍රකට කරලා, තමන්ට හොඳට සිතට වැටහෙන ආකාරයට පත්වුනහම, ඒකට **උග්ගහ නිමිත්ත** කියලා කියනවා.

**පටිභාග නිමිත්ත** :- කියලා කියන්නේ, ඒවා නීවරණ ධර්මයන් හොඳින් යටපත් වෙලා, පැහැදිලිව ප්‍රකට වෙලා එන කොට, ***පටිභාග නිමිත්ත*** කියලා ඒ ධර්මයේ සඳහන් වෙනවා.

ඉතින් ඒ ධ්‍යානයක් අංග අනුව තමයි විස්තර කරන්නේ. **ප්‍රථම ධ්‍යාන, ද්‍විතිය ධ්‍යාන** ආදී වශයෙන් විස්තර කරන්නේ, ඒ ධ්‍යාන අංග අනුව. ධ්‍යාන අංග කියලා කියනවා. ධ්‍යානයක් තුළ තියෙන ඒ අර කුසල් සිත්වල අපි කාමාවචර කුසල් සිත් විස්තර කළා හා සමාන ධර්ම කොටසක් මේ සිත්වලත් හට ගන්නවා.

නමුත් මේවා හැම වෙලාවේ ම **ඤානසම්පයුක්ත සිත්. ඤානවිප්පයුක්ත** රූපාවචර **සිත්** නැහැ. අරූපාවචර **සිතුත්**

**නැහැ.**

එතකොට මේ ධ්‍යානය එක අරමුණක් අර ගෙන උපදවා ගැනීමේ දී, ඒවා **ප්‍රථමධ්‍යාන, ද්‍විතියධ්‍යාන** ආදී වශයෙන් බෙදෙන්නේ, ධ්‍යානයන්ගේ අංග ***සමතික්ක්‍රමන*** වශයෙන්. දැන් සාමාන්‍යයෙන් අපි විදර්ශනාවන් ආරම්මණය අනුව තමයි, බෙදිලා යන්නේ. නමුත් මෙතන **අංග සමතික්ක්‍රමනයක්** තමයි තියෙන්නේ. නමුත් ඒ හැම ධ්‍යානයකට ම අරමුණ එකයි.

අපි කියමුකො ආනාපානසතිය නම්, ආනාපානසතිය නැමති අරමුණ ආශ්වාස ප්‍රශ්වාස අරමුණේ එල්බිලා, ප්‍රථම ධ්‍යාන, ද්‍විතිය ධ්‍යාන, තෘතිය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන, පඤ්චම ධ්‍යාන කියන ධ්‍යාන උපදවා ගන්නවා, පිළිවෙළට.

<u>ප්‍රථම ධ්‍යානය</u>:- එතකොට ඒවා **අංග සමතික්ක්‍රමනය** කියලා කියන්නේ, ප්‍රථම ධ්‍යානයේ අංග තමයි, ***විතක්ක, විචාර, ප්‍රීති, සුඛ, එකග්ගතා*** කියන අංග පහ. එතකොට, ඒ අංග වලින් තමයි ධ්‍යානය හඳුනා ගන්නේ හා  මේ කොයි ධ්‍යානය ද කියලා අපි වෙන් කර ගන්නේ.

<u>ද්‍විතිය ධ්‍යානය</u>:- එතකොට, ප්‍රථම ධ්‍යානයේ ඉන්න කෙනා ද්‍විතිය ධ්‍යානයට යන කොට, විතක්කය මෙනෙහි නො කර, අරමුණට නංවමින් කරන මනසිකාරය නො කර, ***විචාර, ප්‍රීති, සුඛ, එකග්ගතා*** කියන මේ අංගයන් හතර තුළ මනස පවත්වමින් තමයි, ද්‍විතිය ධ්‍යානයට පරිකර්ම කරන්නේ.

එතකොට ප්‍රථම ධ්‍යානයේ ආදීනව හොඳට බලලා, ඒ ධ්‍යානයට තියෙන ඇලුම, ආසාව අයින් කිරීමෙන් ද්‍විතිය ධ්‍යානයට පරිකර්ම සිද්ධ කරනවා. ඒ ධ්‍යාන ලබාගන්න ක්‍රමය යි.

එතකොට, ඇතැම් අය ඉන්නවා, මේ ඉන්ද්‍රිය හොඳට තියුණු අය. සමාධි ඉන්ද්‍රිය ආදී මේ ඉන්ද්‍රියයන් දියුණු අයට පුළුවන් කම තියෙනවා, මේ අංග අර ප්‍රථම ධ්‍යානයේ තිබුණු ***විතක්ක***

***විචාර*** කියන අංග දෙකම, එකවර යටපත් කරලා, ***ප්‍රීති, සුඛ, එකග්ගතා*** කියන අංග තුනෙන් යුක්ත වූ ධ්‍යානයක් ලබාගන්න.

ඒ නිසා තමයි අර නය ක්‍රම දෙකක් පෙන්වලා තියෙන්නේ, **චතුක්ක නය** හා **පඤ්චක නය** කියලා, මේ රූපාවචර ධ්‍යානවල. ඒ දෙකෙන් ම අභිධර්මයේ සඳහන් වෙලා තියෙනවා, මේ පටිච්චසමුප්පාදයේ ත්, විභංගප්‍රකරණය ආදී මේවා ගත්තහම, ධම්මසඞ්ගණිය ගත්තත්, මේ නය ක්‍රම දෙකෙන් ම මේ රූපාවචර ධ්‍යාන විස්තර කරලා තියෙනවා. එතකොට ඒවා අපේ දැනුම සඳහා, අවබෝධය සඳහා දැන ගෙන සිටීමට යි මම මේවා මතක් කරන්නේ ඒ විදියෙන්.

**චතුක්ක නය ක්‍රමය** :- එතකොට, දැන් අපි මේ රූපාවචර සිත් පිළිබඳව ගත්තහම, ඒවා ඊට පස්සේ **චතුක්ක නය ක්‍රමය** නම්, ***විතක්ක විචාර*** දෙක ම යටපත් කරලා, ***ප්‍රීති, සුඛ, එකග්ගතා*** කියන අංග වලින්, **දුතිය ධ්‍යාන, තතිය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන**, මේ විදියට පිළිවෙලින් යනවා.

**පඤ්චක නය ක්‍රමය** :- පඤ්චක නය ක්‍රමයේ දී, විතක්කය පමණක් අයින් කරලා, **විචාරය, ප්‍රීති, සුඛ, එකග්ගතා** - දෙවෙනි ධ්‍යාන, තුන්වැනි, හතරවැනි ධ්‍යාන කියලා, මේ විදියට තමයි ඔය ධ්‍යාන බෙදිලා තියෙන්නේ. මම ඒක පිළිබඳව ආයෙ කතා කරන්නේ නැහැ, ඒක අපට තවත් පොත්පත් වලින් හා බොහෝ මේ පිළිබඳව  දන්නා අය ඉන්න නිසා.

එහි විශේෂතා ගත්තහම රූපාවචර භූමිය කිව්වාම, **රූපාවචර බ්‍රහ්ම ලෝක දහසයක්** තියෙනවා ඔබ දන්නවා.

මේ රූපාවචර භූමිවල ස්කන්ධ වශයෙන් ගත්තොත්, ස්කන්ධ පහක් ම තියෙනවා. **රූපස්කන්ධ, වෙදනාස්කන්ධ, සංඥාස්කන්ධ, සංස්කාරස්කන්ධ, විඤ්ඤාණස්කන්ධ** කියන මේ ස්කන්ධ පහ ම මෙහි තියෙනවා. මෙහි වෙනස, කාමයන් නැතිකම යි.

**රූපාවචර** කියන්නේ, රූප භූමියේ බොහෝ සෙයින් උපදින සිත් කියන අර්ථයෙන් තමයි, රූපාවචර සිත් කියලා ධර්මයේ සඳහන් වෙලා තියෙන්නේ. ***රූපෙ අවචරන්ති රූපවචරා*** කියලා. රූපයේ බොහෝ සෙයින් හැසිරෙන නිසා. නමුත් මේ රූපාවචර සිත් උපදින්න පුළුවන් කාම ලෝකෙත් රූපාවචර කුසල් සිත් උපදවා ගන්න පුළුවන්.

එතකොට, ස්කන්ධ වශයෙන් පහක් තියෙනවා. නමුත් ආයතන වශයෙන් ගත්තොත්, ආයතන සිත් දොළහ යි ක්‍රමයට ගත්තොත්, ආයතන දොළහක් තියෙනවා, ආයතන හය යි රූපාවචර භූමියේ තියෙන්නේ. මොනවා ද ඒවා? **චක්ඛායතනයයි රූපායතනයයි, සොතායතනයයි සද්දායතනයයි, මනායතනයයි ධම්මායතනයයි** කියන මේ ආයතන හය පමණයි රූපාවචර භූමියේ පහල වෙන්නේ.

මොකද, අනිත් ආයතන 6 ගත්තහම, විශේෂයෙන් කාමයන් සඳහා පමණයි තියෙන්නේ. ඇත් වෙන කාරණාවක් කරන්න බැහැ. අපි කියමු, **ගන්ධායතනය ඝානායතනය, ජිව්හායතනය රසායතනය**, මේවා, ධර්ම ශ්‍රවණය කරන්න හෝ එහෙම නැත්නම් බුද්ධ දර්ශනය ආදී මේ දේවල් සඳහා උපකාර වෙන්නේ නැහැ. ඒ නිසා කාමයන් යටපත් කිරීමෙන් ඒවා නැවත රූපාවචර ලෝකවල උපදින්නේ නැහැ.

ඒ නිසා, ආයතන වශයෙන් හය යි. **චක්ඛායතන** කියන එක අපට බුද්ධ දර්ශනය, සංඝ දර්ශනය, ආදී මේවා සඳහා මේ කුසලයන් ඉදිරි කුසල් උපදවා ගන්න අවශ්‍ය වෙනවා.

**සොතායතනය** කියන එකත්, ධර්ම ශ්‍රවණය ආදී කාමයන් පමණක් නෙවෙයි, බොහෝ කුසල් උපදවා ගන්න, මේ ආයතන උපකාර වෙන නිසා, ඒ දේවල් පහල වෙනවා.

එතකොට, **ධාතු** වශයෙන් ගත්තොත්, **චක්ඛු ධාතු, රූප ධාතු,**

**චක්ඛුවිඤ්ඤාණ ධාතු** වශයෙන්, **සොත ධාතු, සද්ද ධාතු, සොතවිඤ්ඤාණ ධාතු** වශයෙන්, හා **මනො ධාතු, ධමම ධාතු මනොවිඤ්ඤාණ ධාතු** කියලා, මේ විදියට ධාතු වශයෙන් සඳහන් වෙලා තියෙනවා.

එතකොට ආහාර වශයෙන් ගත්තහම, ආහාර හතරක් තියෙනවා ඔබ දන්නවා, **කබලිංකාර ආහාරය, ඵස්ස ආහාරය, විඤ්ඤාණ ආහාරය,** හා **මනොසංචෙතනා ආහාරය**.

මේ ආහාර හතරෙන්, ***කබලිංකාර ආහාරය*** රූපාවචර ලෝකයේ නැහැ. අපි අද මේ කන බත්, පාන්, කවුපි, මුං ඇට ආදී වශයෙන් මේ විදියට කැබලි කරලා, කඩලා භුක්ති විඳින මේ ***කබලිංකාර ආහාරය*** රූපාවචර ලෝකයේ නැහැ.

ඒ වාගේම, **සත්‍ය** වශයෙන් ගත්තොත්, **සත්‍ය තුනක්**, මේ රූපාවචර ලෝකයේ පහල වෙනවා, ***දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, මාර්ග සත්‍යය*** කියන සත්‍ය තුන ම මේ රූපාවචර ලෝකයේ පහල වෙනවා.

***නිරොධ සත්‍යය*** භූමියකට අයිති නැති නිසා, ඒක සඳහන් වෙන්නේ නැහැ. අපි මේ භූමියකට දාන්නේ නැහැ, ඒක. සත්‍ය වශයෙන් පහල වෙන්නේ නැහැ.

එතකොට, ඒ විදියට, ස්කන්ධ වශයෙන් පහ යි, ආයතන වශයෙන් හය යි, ධාතු වශයෙන් හයක් තියෙනවා. මොකද, චක්ඛායතන ආදිය තියෙන නිසා, ධම්මධාතුව පහල වෙනවා, එතකොට,**මනො ධාතු, ධම්ම ධාතු, මනොවිඤ්ඤාණ ධාතු** වශයෙන්. ධාතු වශයෙන් හයයි, ආහාර වශයෙන් තුන යි පහල වෙන්නේ. සත්‍ය වශයෙන් පහල වෙනවා, සත්‍ය තුනක් පහල වෙනවා.

ඊට අමතරව, ***ධම්මහදය*** තියෙනවා ඉන්ද්‍රිය කෙතෙක් ද, ස්පර්ශයන් කෙතෙක් ද, සඤ්ඤා කෙතෙක් ද කියලා. ඒ දේවල්

එච්චර ම වැදගත් වෙන්නේ නැහැ. ඒවා අපි පසුව ඒ ***ධම්මහදය විභංගයේ*** කතා කරන දවසක කතා කරමු.

මේකේ තව විශේෂයෙන් දැන ගත යුතු දෙයක් තමයි, මේ රූපාවචර කුසල්, විපාක, ක්‍රියා, කතා කිරීමේ දී, මේ ***ධම්මහදයේ*** තව පරියායක් පෙන්වනවා.

රූප භූමිය ගත්තහම, රූප භූමියේ පහල වෙන සිත් තමයි මේ පෙන්නුවේ. රූප භූමියේ පහල වෙන ස්කන්ධ, ධාතු, ආයතන පෙන්නුවේ.

නමුත්, රූපභූමියටම අදාලම ස්කන්ධ, ධාතු, ආයතන මොනවා ද? ඒවාට කියනවා **රූපාවචර පරියාපන්න ධර්මයෝ** කියලා. ඒ කියන්නේ අපි රූපාවචර ධර්මයෝ කියලා හඳුන්වන්නේ මොනවද? **රූපාවචර කුසල් සිත් පහ යි, විපාක සිත් පහ යි, ක්‍රියා සිත් පහ යි**. ඔවා තමයි රූපාවචර සිත්.

එතකොට, ඒ සිත් පහ ට අදාළ ස්කන්ධ, ධාතු, ආයතන මොනවද කියලා බැලුවොත්, ඒකට අදාළ වෙන කොට, එතකොට රූපාවචර පරියාපන්න ස්කන්ධ හතර යි. ඒ මොනවා ද? ***වේදනා ස්කන්ධය, සංඥා ස්කන්ධය, සංස්කාර ස්කන්ධය*** හා ***විඥ්ඥාණ ස්කන්ධය.***

**රූපස්කන්ධය** කාමාවචර ධර්මයක්. රූපාවචර ධර්මයක් නෙවෙයි **රූපස්කන්ධය.**

ඒ නිසා, රූපාවචර ධර්මයෝ විතරක් ගත්තොත්, ඒ භූමියේ පහල වෙන දේවල් නෙවෙයි, ඒකට අදාළ ධර්ම ගත්තොත්, ස්කන්ධ හතර යි. ආයතන වශයෙන් ගත්තොත්, ආයතන දෙක යි. ඒ මොනවා ද? **මනායතනයයි, ධම්මායතනයයි**. අර කියන ආයතන, **චක්ඛායතන රූපායතන, සොතායතන සද්දායතන, කාමාවචර ධර්මයෝ.** රූප භූමියේ පහල වුනත් ඒවා කාමාවචර

ධර්ම හැටියට තමයි හඳුන්වන්නේ.

ඊට පස්සේ ආයතන වශයෙන් ගත්තහම, ධාතු වශයෙන් ගත්තහම, **ධාතු දෙකයි. මනො විඤ්ඤාණ ධාතුවයි, ධම්ම ධාතුවයි** තමයි ධාතු වශයෙන් දෙකයි.

සත්‍ය වශයෙන් ගත්තොත් **එක සත්‍යයයි. දුක්ඛ සත්‍යය** ගත්තහම.

**සමුදය සත්‍යය, කාමාවචර ධර්මයක්.** අකුසලය හැම වෙලාවේ ම කාමාවචරයි, රූපාවචර අරූපාවචර වෙන්නේ නැහැ. ඒ නිසා, ඒ අකුසල් සිත් කොයි භූමියේ පහල වුනත්, ඒවා කාමාවචර ධර්මයෝ හැටියට තමයි හඳුන්වන්නේ.

ඒ නිසා, **සත්‍ය** වශයෙන් ගත්තහම, **එක සත්‍යයයි**, **දුක්ඛ සත්‍යය.** ඒ කියන ස්කන්ධ ටික අයිති දුක්ඛ සත්‍යයට විතරයි.

- ***මාර්ග සත්‍යය,*** රූපාවචර ධර්මයක් නෙවෙයි.
- ***නිරොධ සත්‍යය*** භූමියකට අදාළ නැහැ, ලෞකික භූමියකට අදාළ නැහැ.
- ***සමුදය සත්‍යය,*** කාමාවචරයි.
- එතකොට, **දුක්ඛ සත්‍යය** විතරයි.

ආහාර වශයෙන් ගත්තහම, ආහාර තුන ම අයිති යි, **ඵස්ස ආහාරය, මනොසංචෙතනා ආහාරය** හා **විඤ්ඤාණ ආහාරය.**

ඔන්න එතකොට මම ඔය පැහැදිලි කළේ, ඒ රූප භූමියේ උපදින්න පුළුවන් ධර්ම මොනවා ද, ඒ රූප භූමියට ම අදාළ ධර්මයෝ මොනවා ද කියලා තමයි කතා කලේ.

එතකොට ඒක ඒ විදියට. දැන් අපි කියමු කෝ, අපි මේ රූපාවචර දෙවියෙක්, රූපාවචර බ්‍රහ්මයෙක්, මනුස්ස ලෝකයට

එනවා. ඒ මනුෂ්‍ය ලෝකයට ඇවිල්ලා, කටයුතු කරන්න පුළුවන්. නමුත් ඒ බ්‍රහ්මයා මනුස්ස ලෝකයට ආවා කියලා, එයා මනුස්සයෙක් වෙන්නේ නැහැ. එයා රූපාවචර බ්‍රහ්මයෙක්මයි.

එතකොට ඒ වගේ, මේ කාම ලෝකයේ තියෙන සිත්, රූපාවචර භූමියේ පහල වුනා කියලා, ඒවා රූපාවචර ධර්ම වෙන්නේ නැහැ. ඒවා කාමාවචර ධර්ම ම තමයි.

අන්න ඒ නිසා තමයි, මේ රූප භූමියේ පහල වෙන්න පුළුවන් ධර්ම තියෙන. හැබැයි, රූපාවචර භූමියට ම අදාළ, ආවේණික ධර්ම තියෙනවා. ඒවා හඳුන්වන්නේ රූපාවචර පරියාපන්න ධර්මයෝ රූපාවචර පරියාපන්න නොවන ධර්මයෝ හැටියට තමයි, ඔය **ධම්මහදය විභංගයේ** බෙදලා පෙන්වන්නේ. ඒක ඔබට ඕනෑ නම්, ඒ ඔබට දැනුම සඳහා පෙන්නුවේ, දහම් අවබෝධය සඳහා.

එතකොට, ඔබ දන්නවා රූපාවචර බ්‍රහ්ම ලෝක දහසයක් සඳහන් වෙලා තියෙනවා. ඒ හැම ලෝකයක ම මේ රූපය තියෙනවා. ඇතැම් අය විග්‍රහ කරනවා, මේ අරූපයේ එහෙම රූප නැහැ කියලා. නමුත් මේක ගත්තහම... (ඒක අපි ඉදිරියේ දී කතා කරමු)

රූපාවචර බ්‍රහ්ම ලෝක ගත්තහම, අර විදියට බ්‍රහ්ම ලෝක දහසය ම, රූපස්කන්ධය තියෙනවා. එහි නැත්තේ, කාමය විතරයි. රූපය තියෙනවා. ඒක තමයි වෙනස ඒකේ.

එතකොට, ඒ රූපාවචර සිත් අපි පටිච්චසමුප්පාද ක්‍රමයට අද අපි කතා කරමු. දැන් අපට අවශ්‍ය වෙන්නේ මෙතන, ඒ ධ්‍යාන ලබාගන්න හැටි වත්, ඒවා අමතර කාරණා වශයෙන් මෙතැනට අදාළ නිසා කතා මම කළේ. නමුත් අපි පටිච්චසමුප්පාදය ගත්තහම මේකේ අභිධර්මභාජනීය විස්තර කරන්නේ, ඒ

රූපාවචර සිතක් උපදින්නේ කොහොමද, මේ පටිච්චසමුප්පාද ක්‍රමයට අනුව කියලා තමයි අපි කතා කරන්නේ.

එතකොට, මෙකේ හඳුන්වලා තියෙන්නේ කොහොම ද? ***කතමෙ ධම්මා කුසලාඃ යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති***, රූපාවචර ලෝකයේ ඉපදීම සඳහා මාර්ගය වඩාද, ***විවිච්චෙව කාමෙහි***, කාමයන්ගෙන් වෙන්ව, ***විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීති සුඛං පඨමඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං*** කියලා ඔන්න විස්තර කරනවා. එතකොට මේ <u>රූපාවචර ප්‍රථම ධ්‍යානය</u> තමයි මාතෘකා කළේ.

මොනවා ද ඒ කුසල ධර්මයෝ? ඒ කුසල ධර්මයෝ රූපාවචර මාර්ගය වඩයි ද, ඒ **ප්‍රථමධ්‍යානය** සඳහා පරිකර්ම කරයි ද, ***තස්මිං සමයෙ***, ඒ සමයෙහි ***කුසලමූලපච්චයා සඞ්ඛාරො, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමං, නාමපච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා පසාදො, පසාදපච්චයා අධිමොක්ඛො, අධිමොක්ඛපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති,*** කියලා ඔන්න පටිච්චසමුප්පාදය සිද්ධ වෙන හැටි.

ඒ කියන්නේ, මේ රූපාවචර සිතක් ඉපදෙන කොට, ඒ සිත ඉපදුණේ මෙන්න මේ ආකාරයටයි. ***කුසලමූලපච්චයා සඞ්ඛාරො***. කුසල මූල කිව්වේ මොනවා ද කියලා අපි කතා කරා. **අලෝභ, අද්වේශ, අමෝහ කියන මේ ධර්මයෝ තමයි කුසල මූල** හැටියට සඳහන් වෙන්නේ.

එතකොට, අර කාමාවචර සිත් වලත් මේ ටිකම තිබ්බා, **අලෝභය, අද්වේශය, අමෝහය**. නමුත් මෙකේ ඒ ආරම්මණය වෙනස්. ඒ තියෙන අලෝභ ස්වභාවය, අද්වේශ ස්වභාවය,

අමෝහය කියන ප්‍රඥාවේ, නුවණේ වෙනස්කම් තියෙනවා. ඒ වෙනස්කම් තමයි මෙතන අපි පරිකර්ම ක්‍රම නුවණ යොදලා තියෙන්නේ. මේ යම් කසිනාරම්මනයක් හෝ යම් සමථ කර්මස්ථානයක් අරමුණු කරමින්, ඒ කාමාවචර, ඒ කියන නීවරණ ධර්මයන් කාමයන් යටපත් කිරීම් වශයෙන් තමයි මනසිකාර කරන්නේ. එතකොට ඒ කාමයන්, නීවරණ ධර්මයන් අතහැරීම සඳහා ඇති කර ගන්නා, ***අලෝභ අද්වේශ*** තමයි මෙතන අපි ගත යුත්තේ.

ධර්ම වශයෙන් ගත්තහම එකම නම තමයි තියෙන්නේ. එතකොට, ***කුසලමූලපච්චයා*** කියන ඒ කුසල මූලයන් නිසා, ඒ ප්‍රත්‍යයෙන් තමයි **සඞ්ඛාරය** කියන චේතනාව උපදිනවා නම් උපදින්නේ. ඒ චේතනාව අපි මේ පරිකර්ම කරන චේතනාව යි.

***සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං*** කියන කොට, ඒ විඤ්ඤාණය තමයි, මොකක්ද, අර කියපු මේ ප්‍රථමධ්‍යාන කුසල් සිත තමයි මෙතන විඤ්ඤාණය හැටියට ගන්නේ. අපි අනිත් සිත්වල ගත්තේ ඒ අදාළ කාමාවචර කුසල් සිත නේ. මෙතන ***සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං*** කියන කොට, ඒ රූපාවචර ප්‍රථමධ්‍යාන කුසල් සිත තමයි, ***සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං*** කියලා ගන්නේ.

***විඤ්ඤාණපච්චයා නාමං*** කියන කොට, ඒ නාමයත් අර විදියට ම ***වෙදනා, සංඥා, සඞ්ඛාර*** කියන මේ ධර්ම ටික. හැබැයි, මේ ධර්ම අර ප්‍රථමධ්‍යාන කුසල් සිතේ තියෙන **වේදනා, සංඥා, සඞ්ඛාර** ටික තමයි අපි මෙතෙන්ට ගන්න ඕන. එතකොට, ඒ විදියට ඒ සිතට අදාළ අනුකූලව අපි ඇහිඳලා ගන්න ඕන ඒ ධර්ම ටික.

***නාමපච්චයා ඡට්ඨායතනං*** කියන කොට, නාම කියන කොට ඒ සිතේ තියෙන **වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර**, නාම ධර්ම යි. ඒ නාම ධර්ම ප්‍රත්‍ය වෙනවා, **ඡට්ඨායතනයට**. එතකොට, **ඡට්ඨායතනය**

කිව්වේ මොකක් ද? ඒ කියන මනායතනය යි. ඒ මනායතනයේ වෙන්නේ මොකක්ද? මේ කියපු **රූපාවචර ප්‍රථමධ්‍යාන කුසල් සිතමයි**, **ෂට්ඨායතනය** හැටියට හඳුන්වන්නේ.

***ෂට්ඨායතනපච්චයා ඵස්සො*** කියන කොට, අර විදියට ම, මේ සිතේ ස්පර්ශය නිසා, මේ ආයතනයේ ස්පර්ශය නිසා ඇතිවීම යි. ආයතනය නිසා හැදෙන ස්පර්ශය යි. ඊට පස්සේ, ***ඵස්සපච්චයා වෙදනා***. වේදනාව මොකක් ද? මේ සිතේ තියෙන **සොමනස්ස සහගත වේදනාව** තමයි අදාළ වෙන්නේ.

එතකොට, ***වෙදනාපච්චයා පසාදො***. මෙතැන අර කියපු ***පසාදො*** කියන එක තමයි කුසල්වල හැම වෙලාවේ ම හඳුන්වලා තියෙන්නේ. **ප්‍රසාදය** කියන්නේ අරමුණේ පැහැදීම යි. අරමුණට ඇති විශ්වාසය යි, ප්‍රසාදයේ බැස ගැනීම යි.

එතකොට, ***පසාදපච්චයා අධිමොක්ඛො*** කියලා කියන්නේ, දැඩිව අරමුණේ පිහිටා සිටීම, බැස ගැනීම, ***අධිමොක්ඛය***. උපාදාන ස්ථානය වෙනුවට තමයි මෙතන ***අධිමොක්ඛය*** හඳුන්වලා තියෙන්නේ.

එතකොට, ***අධිමොක්ඛපච්චයා භවො. භව*** කියන කොට ඒ ඒ ස්කන්ධයන්ගේ ම පහල විම තමයි, භවය හැටියට කියන්නේ. මේ **ඒකක්ෂණික** පටිච්චසමුප්පාදය නේ එතකොට, හඳුන්වන්නේ.

මේ ටික ඔක්කෝම අර විදියට දත යුතුයි.

එතකොට මේකේ ලොකු වෙනසක් නැහැ. මේ අර කාමාවචර කුසල් සිතේ වගේ ආරම්මණය හා ඒ නුවණවල වෙනස අපි සිතා ගන්න විතරයි තියෙන්නේ. උපදින ධර්ම වල වෙනසක් නැහැ.

එතකොට මේක පටන් ගන්න කොට තියෙන වෙනස විතරයි තියෙන්නේ. දැන් අර අපි කාමාවචර කුසල් සිත් කතා කළේ

***රූපාරම්මණංවා, සද්දාරම්මණංවා, ගන්ධාරම්මණංවා*** කියලා යි.

මෙතන අරමුණු වෙන්නේ හැම වෙලාවේ ම, **සමථ නිමිත්ත යි.** පඨවි කසිනය කියලා මේකේ දාලා තියෙන්නේ. නමුත් ආනාපානසතිය වෙන්න පුළුවන්, වෙනත් සමථ කර්මස්ථානයක් තමයි ආරම්මණය හැටියට දාලා මේ ධ්‍යාන හඳුන්වන්නේ. එතකොට ප්‍රථමධ්‍යානය යි.

ඊට පස්සේ, මේ විදියට ම, මේ නය ක්‍රම හතර ම, දැන් ***විඤ්ඤාණපච්චයා නාමං, විඤ්ඤාණපච්චයා නාමරූපං, විඤ්ඤාණපච්චයා සළායතනං*** කියන මේ තැන්වල, අර කියන අන්තිම වාරයේ, හඳුන්වලා තියෙන්නේ ***නාමරූපපච්චයා සළායතනං*** කියන මේ වාරය මේකේ ලැබෙන්නේ නැහැ. එච්චරයි මේ වාගේ වෙනස තියෙන්නේ. වෙන විශේෂ වෙනසක් සඳහන් වෙලා නැහැ.

ඒ විදියට, ප්‍රථමධ්‍යාන, ද්‍රුතියධ්‍යාන ගත්තහම, දැන් ඊට පස්සේ දෙවැනි ධ්‍යානය ගත්තහම, ***කථමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විතක්කවිචාරානං වූපසමා*** කියලා මේ චතුක්ක නය ක්‍රමයට, හතර නය ක්‍රමයට පෙන්වන්නේ. එතකොට, දෙවැනි ධ්‍යානයේ දී, ***විතක්කවිචාරානං වූපසමා*** කියන්නේ, මේ විතක්ක විචාර අඞ්ග දෙකම යටපත් කරලා යි.

ඔබ දන්නවා, මේ **විතක්ක විචාර** කියලා කියන්නේ, මේ ධ්‍යානයක් උපදවා ගන්න කොට, හැම වෙලාවේ ම, ඒ අරමුණට නිතර නිතර සිත නැංවීම, ඒ අරමුණ තුළ නිතර නිතර සිත හැසිරවීම කියන එක මේ කාරණාව අත්‍යවශ්‍යයි. එතකොට, තමයි මේ ධ්‍යානයක් උපදවා ගන්න පුළුවන්. ඒවා විදර්ශනාවේත් මේ විතක්ක විචාර තියෙනවා.

එතකොට මේ චතුක්ක නය ක්‍රමයේ දී, දෙවැනි ධ්‍යානයේ දී,

එයාට මේ පළවෙනි ධ්‍යානයෙන් කාම ධර්මයන්, සම්පූර්ණ නීවරණයන් යටපත් කරලා, ප්‍රථමධ්‍යානය ලබාගෙන වශී කරලා තියෙන නිසා, නැවත එයාට විශේෂ උවමනාවක් නැහැ, මේ විතක්ක විචාරයන්ගෙන්.

ඒ හේතුව අර නීවරණ ධර්මයන්ගේ බලපෑම තිබුනොත් තමයි, නැවත නැවත අරමුණට නංවමින්, ඒ අරමුණේ හැසිරීම කියන එක අවශ්‍ය වෙන්නේ. නීවරණ හොඳින් යටපත් කරලා තියෙන නිසා, මේ අරමුණ තුළ පහසුවෙන් සිත පවත්වන්න පුළුවන් නිසා, ප්‍රථම ධ්‍යානයේ තියෙන ඒ ආසාව යටපත් කරලා, අත්හැරලා, දුතිය ධ්‍යානය ලබනවා, විතක්ක විචාර වලින් තොර ව, ***පීති සුඛ එකග්ගතා*** කියන දුතියධ්‍යානය.

ඒ විදියට, ඒ **දුතියධ්‍යාන** සිත උපදින ආකාරය ගත්තහම, ඒ අරමුණේ ම තමයි උපදින්නේ. එතකොට, ඒකේ වෙනසක් නැහැ. අර කියපු පටිච්චසමුප්පාද ක්‍රමයමයි. ***කුසලමූලපච්චයා සඞ්ඛාරෝ, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමං*** කියන මේ පටිච්චසමුප්පාද ධර්මතාවය එකයි. මොකද, ඒ සිතේ හට ගන්න ධර්ම එකයි. ආරම්මණය හා මනසිකාරයන්ගේ වෙනස විතරයි.

**තතියධ්‍යානය** ගත්තහම, ඒක **පීති** අත්හැරියා ම, **සුඛ එකග්ගතා**.

**චතුත්ථධ්‍යානය**, **සුඛ එකග්ගතා** ඉඳලා **උපෙක්ඛා එකග්ගතා** කියලා තමයි චතුත්ථධ්‍යානයේ හඳුන්වන්නේ.

එතකොට,මේ ධ්‍යාන පිළිබඳව මම ලොකුවට, දීර්ඝව විස්තර කරන්න යන්නේ නැහැ. එතකොට මේ පළවෙනි, දෙවැනි, තුන්වැනි, සතරවැනි ධ්‍යාන, **චතුක්ක නය ක්‍රමය යි**.

**පඤ්චම නය ක්‍රමය ගත්තොත්, ඒකත් මෙතැන පෙන්නනවා. පඤ්චම නය ක්‍රමය** ගත්තොත්, පළවෙනි ධ්‍යානය දෙකේ ම

සමානයි. දෙවෙනි ධ්‍යානය ***විතක්ක විචාර*** නැතුව, ***විතක්කං වූපසමානං*** කියලා, **විතර්කය** පමණක් අත්හැරලා තමයි දෙවෙනි ධ්‍යානය පෙන්වන්නේ. එතකොට තමයි ධ්‍යාන පහක් වෙන්නේ.

මේ ධ්‍යාන පහේ ම කුසල යි. රූපාවචර කුසල ගත්තහම, ඒකේ පටිච්චසමුප්පාදය හට ගන්න ආකාරය හා ඒ ඒ පටිච්චසමුප්පාදයේ අන්තර්ගත ධර්ම වල, කිසිදු වෙනසක් වෙන්නේ නැහැ. අර මම මුලින් සඳහන් කරපු ප්‍රථම ධ්‍යානයේ ධර්ම, ඒ පටිච්චසමුප්පාදය හට ගන්න හා සමානව තමයි මේ රූපාවචර කුසල් සිත් පහ ත් හට ගන්නේ.

එතකොට, ඒ රූපාවචර ලෝකය තුළ උපදින කුසල් සිත් ටික.

එතකොට මේවා භූමි වශයෙන් ගත්තහම, ප්‍රථම ධ්‍යානයට රූපාවචර භූමි 3 ක් හැටියට. ඔබ දන්නවා, **බ්‍රහ්මපාරිසජ්ජ, බ්‍රහ්මපුරෝහිත, මහාබ්‍රහ්ම** කියලා, ප්‍රථමධ්‍යාන තල තුන යි.

මේ විදියට, බ්‍රහ්ම ලෝක දහසය ක් තියෙනවා. ඒ දහසයෙන්, සතරවෙනි බ්‍රහ්ම ලෝකයට අදාල වෙන, **පඤ්චසුද්ධාවාස** කියලා, රූපාවචර බ්‍රහ්ම ලෝක පහ ක් තියෙනවා. ඒවායේ, අනාගාමී මාර්ග ඵල ලාභීන් පමණයි උපදින්නේ. ***අවිහය, අතප්පය, සුදස්ස, සුදස්සී, උද්දංසොත, අකනිට්ඨයගාමී,*** කියලා ආර්‍ය්‍යයන් වහන්සේලා විතරක් පහල වෙන, රූපාවචර බ්‍රහ්ම ලෝක වෙනම පහක් තියෙනවා.

මේවා ඔක්කෝමත් එක්ක, අසඤ්ඤ තලයත් එක්ක, රූපය විතරක් පවතින **අසඤ්ඤතලය** කියලා තව භූමියක් තියෙනවා. ඒකේ රූපය පමණයි පහල වෙන්නේ. වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ පහල වෙන්නේ නැහැ, ඒ භූමි ලෝකයේ. ඒකට කියනවා, **එකෝකාර භූමිය** කියලා හඳුන්වලා තියෙන්නේ.

ඒ රූපාවචර භූමියේ දී, එයා ඒ ධ්‍යානය පරිකර්ම කරන කොට, මේ හිත තමයි හැම දේකට ම මුල. හිත තියෙන නිසාම යි හැම දුකක් ම උපදින්නේ කියලා, විඤ්ඤාණයේ, සිතේ නිරෝධයට, එහි කලකිරීමට, නො ඇලීමට බලමින්, වාසය කරපු නිසා, ඒ රූපාවචර ලෝකවල, බොහෝ සෙයින් අර කියන අසඤ්ඤ තලයේ, රූපය පමණක් පහල වෙන ඒ අසඤ්ඤ තලයේ එයා මේ මිත්‍යාදෘෂ්ඨික තැනක් හැටියට තමයි අසඤ්ඤතලය හඳුන්වලා තියෙන්නේ. ඒ හේතුව, ඒක අහේතුක උප්පත්තියක් හැටියට හඳුන්වන්නේ. <u>කිසිදු දෙයක් විදර්ශනාවක්, මාර්ග ඵලයක්, උපදවා ගන්න බැරි තැනක් ඒක. ඒ අසඤ්ඤතලය කියන එක.</u>

ඒකට, **එකෝකාර භූමිය** කියලා හඳුන්වලා තියෙන්නේ, ඒක **එක ස්කන්ධයක්** පමණක් තියෙන නිසා යි. **ආයතන** වශයෙන් ගත්තොත්, **ධම්මායතනයයි, රූපායතනයයි** පමණයි තියෙන්නේ. ආයතන වශයෙන් දෙක යි. **සත්‍ය** වශයෙන්, ඒක සත්‍යය යි තියෙන්නේ. **දුක්ඛ සත්‍යය** විතර යි, ඒ **අසඤ්ඤතලයේ** තියෙන්නේ. ඒ වාගේ යම් වෙනසක් තියෙනවා.

එච්චර යි අපට මේ රූපාවචර කුසල් සිත් පිළිබඳව අපට විශේෂයෙන් දැන ගත යුතු කාරණා. පටිච්චසමුප්පාදයේ අර කියපු පළවෙනි සිත හා සමානව තමයි උපදින්නේ.

ඊට පස්සේ, **රූපාවචර විපාක සිත්** සහ **ක්‍රියා සිත්**. මම මෙතැන මේකත් අර ගෙන කතා කරනවා. ඒ **රූපාවචර විපාක සිත්** මේ ප්‍රථම ධ්‍යාන කුසල් සිතට අනුරූපව විපාක සිත ඒ භූමිවල ලැබෙනවා. ක්‍රියා සිතුත්, ඒ රූපාවචර භූමිවල ම තමයි ලැබෙන්නේ.

එතකොට, රූපාවචර ක්‍රියා, ධ්‍යාන, රහත් වුනායින් පස්සේ, කාම ලෝකෙත් උපදවා ගන්න පුළුවන් කම තියෙනවා.

රූපාවචර ලෝකෙත්, ඒ ක්‍රියා ධ්‍යාන ලැබෙනවා. නමුත්, විපාක සිත්, රූපාවචර විපාක ධර්ම, මේ රූපාවචර භූමියේ පමණයි පහල වෙන්නේ.

එතකොට ඒ රූපාවචර විපාක, ක්‍රියා, ධ්‍යාන ගත්තහම, ඒ ධ්‍යාන සිත්වලත්, අර කුසල් සිත වාගේම යි, වෙනසක් නැහැ. වෙනස තියෙන්නේ, **රූපාවචර ක්‍රියා, ධ්‍යාන** කතා කරන කොට, ඒකේ දී අර ***කුසලමූලපච්චයා*** කියලා, සඳහන් කරන්නේ නැහැ. මොකද, ඒ **ක්‍රියා, ධ්‍යාන** කියන ඒවා, කුසලත් නො වන, අකුසලත් නො වන, කර්ම විපාකත් නො වන නිසා ඒ රූපාවචර **ක්‍රියා ධ්‍යාන** හඳුන්වන කොට, **කුසලමූලපච්චයා කියලා නෙවෙයි, *සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං* කියලා** තමයි, ඒ **ක්‍රියා ධ්‍යාන** පටන් අරගන්නේ. රූපාවචර ක්‍රියා ධ්‍යාන. එච්චරයි.

***සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමං, නාමපච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා පසාදො, පසාදපච්චයා අධිමොක්ඛො, අධිමොක්ඛපච්චයා භවො*** කියලා, අනිත් පටිච්චසමුප්පාද අංග ඒ විදියට ම ධර්මයේ සඳහන් වෙලා තියෙනවා. වෙනස තියෙන්නේ ක්‍රියාවල විතරයි. අනිත් ඒවාගේ වෙනසක් නැහැ. ක්‍රියා සිත්වල, කුසලත් නොවුනු, අකුසලත් නොවුනු, කර්ම විපාකත් නොවුනු සිත් නිසා.

ඒ සිත්වල තියෙන ධර්ම වශයෙන් ගත්තහම, ස්වභාවයන් එකයි, පටිච්චසමුප්පාදය එකයි. ඒ නිසා තමයි, මම ඒවා ඔක්කෝම පොදුවේ එකට අර ගෙන කතා කළේ.

ඊළඟ අරූපාවචර සිත්. එච්චරයි අපි විශේෂයෙන් ඊට අමතරව දැන ගත යුතු දේවල් තියෙනවා නම් විස්තර නොවුනු, මේකේ තව කතා කරන්න පැති තියෙනවා. මම අර මේ දේවල් බොහෝ දේවල් කතා කරන්න ගියොත් අපේ මේ අරමුණ වෙනස් වෙනවා. අත්‍යාවශ්‍ය යමක් හෝ පැටැලෙන යමක් තියෙනවා

නම් ඔබට ඒ සාකච්ඡාවේ දී විමර්ශකය කරන්න පුළුවන්. එහෙම නැතිනම් ප්‍රශ්න හෝ යොමු කරන්න පුළුවන්.

ඒ නිසා දැන් මම මෙතැනින් රූපාවචර කුසල විපාක ක්‍රියා නිර්දේශ වර්ණනාව අවසන් කරනවා.

ඒ මෙතෙක් අපි කතා කළේ, රූපාවචර සිත්වල පටිච්චසමුප්පාද ක්‍රමය යි. ඒ කියන්නේ, රූපාවචර සිතක් උපදින්නේ කොහොමද, පටිච්චසමුප්පාද ක්‍රමයට. එතකොට, ඒ එක්ක්ෂණික පටිච්චසමුප්පාදය, එක සිතක් තුළ පටිච්චසමුප්පාද ධර්මතාවය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එකයි කතා කළේ.

**අරූපාවචර සිත් ඊළඟට තියෙන්නේ** අපට. මේ රූපාවචර කුසල් සිත්වල එක්කම, පෙය්‍යාලම් ක්‍රමයට, මේ අරූපාවචර, ඒ වාගේම ලෝකෝත්තර සිත් ඔක්කෝම මෙතන සඳහන් කරලා තියෙනවා. මොකද, හේතුව? ඒ න්‍යායයන්, ඒ ඒ පටිච්චසමුප්පාද ක්‍රමවේදයන් හැම එකක් ම සමාන නිසා.

එතකොට, අරූපාවචර සිත් විස්තර කරලා තියෙන්නේ, ***කථමෙ ධම්මා කුසලාඃ යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති.*** කියලා පෙන්නලා තියෙනවා. එතකොට ***ලොකුත්තරං ඣානං භාවෙති. නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි*** -පෙ- ***පඨමං ඣානං උපසම්පජ්ජ විහරති***, කියලා මෙතන ඔක්කෝම හකුළුවලා තමයි, මේ පටිච්චසමුප්පාදයේ මේ පෙන්වලා තියෙන්නේ. මොකද, අපි අර **රූපාවචර පඤ්චමධ්‍යානය** විස්තර කළා නම්, ඒ සිතට සමානයි, මේ අරූපාවචර කුසල් සිත් ටිකත්. ඒකේ වෙනස තියෙන්නේ, ***කුසලමූලපච්චයා*** කියලා ම පටන් ගන්නවා. ඒ වගේ අපි **භූමි** වශයෙන් වෙනස්කම් තියෙනවා. **ස්කන්ධ, ධාතු ආයතන** වශයෙන් වෙනස්කම් තියෙනවා. ඒවා තමයි වෙනස්කම් හැටියට

තියෙන්නේ.

දැන් අරූපාවචර ලෝකය කියලා කියන්නේ, අපි ඒක විස්තර කළොත්, **රූපයෙන් තොර ව, වේදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ කියන නාමස්කන්ධ පමණක් පහල වෙන භූමි තමයි, අරූපාවචර ලෝක කියලා හඳුන්වන්නේ.**

එතකොට, අරූපාවචර ලෝකයේ ස්කන්ධ තියෙන්නේ හතර යි. එතකොට ඒ අරූපාවචර සිත් වශයෙන් කුසල් සිත් හතර යි, විපාක සිත් හතර යි, ක්‍රියා සිත් හතර යි. හතර වරක් තුන දොළහ යි.

ඔබ දන්නවා **ආකාසානඤ්චායතන, විඤ්ඤාණංචායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන** කියලා, ඔය විදියට තමයි, ඒ ධ්‍යාන සිත් හඳුන්වලා තියෙන්නේ. ඒ ධ්‍යාන සිතේ නමින් ම යි භූමියත් හඳුන්වලා තියෙන්නේ.

දැන් අර රූපාවචර ලෝකවල ධ්‍යාන සිත එකක්. භූමියේ නම් බ්‍රහ්ම ලෝක හඳුන්වලා තියෙන්නේ, **බ්‍රහ්මපාරිසජ්ජ, බ්‍රහ්මපුරෝහිත, මහාබ්‍රහ්ම** ආදී වශයෙන්. නමුත් සිත ගත්තොත්, **ප්‍රථමධ්‍යාන සිත** කියලා.

නමුත්, මේකේ අරූපාවචර සිත් ගත්තහම, ඒවාගේ සිත නම් කරන්නේත්, භූමියේ ම නමින්. ඒ දෙකම එකයි. එතකොට, ඒකේ වෙනස තමයි, රූපය ශේෂයක් වත් පහල වෙන්නේ නෑ, ඒ අරූපාවචර ලෝකයේ.

හොඳට මතක තියා ගන්න, බොහෝ අය මේ **නාමරූප** කියන කතාව, නාමරූපයන්ගෙන් තොර ව විඤ්ඤාණයක් නැහැ කියන එකත් එක්ක, මේ පටිච්චසමුප්පාද න්‍යායයන්වල ඇති යම් යම් අනවබෝධයන් නිසා, සියුම් වූ රූපයක් මේ අරූපාවචරයේ තියෙනවා කියලා, ඇතැම් අය විග්‍රහ කරනවා අපට ඇහිලා තියෙනවා. එහෙම කිසිදු රූපයක්, එක දූ

රූපස්කන්ධයේ අල්ප මාත්‍රයක්වත් අරූප ලෝකයේ නැහැ.

ඒවා ඔය අපි ගත්තහම **කතාවත්ථු ප්‍රකරණයේ** ඒවා හොඳට ඛණ්ඩනය කරලා තියෙනවා. ඒ කාලයෙත් එබඳු දෘෂ්ටි ආව නිසා. මේ අරූපයේ රූප තියෙනවා කියලා ***අරූපෙ රූපන්ති ඛතන්ති*** කියලා, මොග්ගලිපුත්ත මහ රහතන්වහන්සේ විසින් ඒ දෘෂ්ටි ඛණ්ඩනය කරනවා.

එතකොට, ඒ **රූප ලෝකයේ** ස්කන්ධ හතර **යි. ආයතන වශයෙන් තියෙන්නේ** දෙක **යි**, මනායතනයයි, ධම්මායතනයයි. **ධාතු වශයෙන්** දෙක යි, **මනොවිඤ්ඤාණ ධාතුවයි, ධම්ම ධාතුවයි** තමයි. ධාතු වශයෙන් දෙකයි තියෙන්නේ.

**සත්‍ය** වශයෙන් ගත්තහම, **සත්‍ය** තුන ක් එහි පහල වෙන්න පුළුවන්, **දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය** හා **මාර්ග සත්‍යය** කියන සත්‍ය පහල වෙන්න පුළුවන්.

හැබැයි, එහි විශේෂයක් දැන ගෙන සිටිය යුතුයි. ඒ අරූපාවචර ලෝකයේ, වෙනත් භූමියක සෝවාන් ඵලයට පත් වෙලා ගියොත්, ඉතුරු මාර්ග ඵල ටික ලබන්න පුළුවන් කම තියෙනවා.

<u>නමුත් ඒ භූමියට ගිහිල්ලා කෙළින්ම මාර්ග ඵල උපදවා ගන්න බැහැ. හැබැයි, මේ රූපාවචර ලෝකවල පුළුවන්.</u>

ඊට හේතුව තමයි, අරූපාවචර ලෝකයේ ආයතන වශයෙන් දෙක යි තියෙන්නේ. මනායතනයයි, ධම්මායතනයයි. අර ධර්ම ශ්‍රවණය කිරීම, බුද්ධ දර්ශනය ආදී මේ දේවල් නැති නිසා. මොකද, චක්ඛායතන, සොතායතන ආදිය එහි පහල වෙන්නේ නැහැ. ඒවා රූපස්කන්ධයට අදාළ ධර්ම යි.

ඒ නිසා, අරූපයේ අලුතින්, මුලින්ම මාර්ග ඵල උපදවා ගන්න බැහැ. මාර්ග ඵල උපදවා ගත්ත කෙනෙකුට, එහි ගිහිල්ලා, ඉතුරු මාර්ග ඵල ටික ලබාගන්න පුළුවන් කම තියෙනවා.

ඒ නිසා, **ආයතන** දෙක යි, ඊට පස්සේ **ධාතු ත්** දෙක යි තියෙන්නේ, **ආහාර** තුන ක් තියෙනවා. **ස්පර්ශ ආහාරය, විඤ්ඤාණ ආහාරය, මනොසංචෙතනා ආහාරය** කියලා ආහාර තුන ක් තියෙනවා.

**හේතු** හඳුන්වන කොට, හේතු පිළිබඳව මට ඉස්සෙල්ලා කතා කරන්න බැරි වුනා. ඒකත් වැදගත්. හේතු නවයක් ගැන මේ සාසනයේ සඳහන් වෙනවා. කුසල හේතු තුන යි, අකුසල හේතු තුන යි, විපාක හෙවත් ක්‍රියා අව්‍යාකෘ හේතු තුන යි.

එතකොට, ලෝභ, ද්වේෂ, මෝහ, **අකුසල හේතු** තුන යි. අලෝභ, අද්වේශ, අමෝහ, **කුසල හේතු** තුන යි. **අව්‍යාකත හෙවත් ක්‍රියා සිත්වල, විපාක සිත්වල** පහල වෙන, අලෝභ, අද්වේශ, අමෝහ කියලා හේතු තුන ක් සඳහන් වෙලා තියෙනවා. එතකොට, ඔක්කොම හේතු නවය යි.

ඒ හේතු නවයෙන්, අරූපාවචර ලෝකයේ අකුසල හේතු වලින් **ද්වේෂය** නැමති හේතුව පහල වෙන්නේ නැහැ. අනිත් හේතු ටික ඔක්කොම පහල වෙනවා. හේතු අට ක් පහල වෙනවා, රූපාවචර ලෝකයේත් අරූපාවචර ලෝක වලත්.

අර කියාපු කුසල් හේතු තුන ම පහල වෙනවා. අව්‍යාකත විපාක හේතු අලෝභ, අද්වේශ, අමෝහ, තුන ම පහල වෙනවා, හයයි, ලෝභය නැමති අකුසල හේතුව යි, මෝහය නැමති අකුසල හේතුව යි කියන මේ ටිකත් පහල වෙනවා.

එතකොට ඒ විදියට මේ අරූපාවචර භූමිය ගත්තහම, ඒ කියපු භූමියේ විස්තර තමයි කතා කළේ.

එතකොට ඒකේ විශේෂ තැන් අපි තව මග හැරුණු තැන් තිබුනොත් මම ඉදිරියේ දී සාකච්ඡාවට අර ගෙන මතු කරලා පෙන්නන්නම්, වරින් වර. ඊට අමතරව ප්‍රශ්න වශයෙනුත් මේ

පිළිබඳව නො තේරෙන තැන් තිබුනොත් කතා කරන්න පුළුවන්.

එතකොට මේ අරූපාවචර ධ්‍යාන, හැම වෙලාවේ ම, උපදවා ගැනීමේ දී, ඒ දේවල් වල අරමුණ වෙනස්.

දැන් රූපාවචර බ්‍රහ්ම ලෝකවල අරමුණ හැම වෙලාවේ ම සම්මුති අරමුණක්. පරමාර්ථයක් නෙවෙයි.

අරූපාවචර භූමිවල ආරම්මණය සම්මුති ආරම්මණ දෙක ක් තියෙනවා, පරමාර්ථ ආරම්මණ දෙක ක් තියෙනවා.

එතකොට ඒ අරූපාවචර භූමිවල උපදින්නේ, හැම වෙලාවේ ම කාම ධර්මයන් හා රූපය පිළිබඳව තියෙන සියලු ආසාව, එක දු රූප නිමිත්තක් පිළිබඳව, කාමයන් පිළිබඳව නෙවෙයි, රූප නිමිත්තක් පිළිබඳව හෝ යම් ඇලීමක් ආසාවක් තියෙනවා නම්, ඒ තාක් අරූපාවචර සිත් උපදින්නේ නැහැ.

ඒ නිසා, රූපය පිළිබඳව හොඳින් කාමයන් රූපයන් ආදී මේ ධර්ම පිළිබඳව හොඳින්, ඒවා පිළිබඳව ආසාව, කෙලේසයන්, නීවරණ ඉතා බලවත් ලෙස, යටපත් කිරීම නිසා තමයි, මේ අරූපාවචර සිත් උපදින්නේ. එතකොට ඒ කර්මයේ ස්වභාවයම රූපයට තියෙන ආසාව, කෑදර කම සහමුලින්ම අයින් කරලා තියෙන්නේ.

ඒ නිසා තමයි, රූපය නැතුව, නාම ධර්ම පමණක් ඒ භූමියේ පහල වෙන්නේ.

එතකොට ඒ අරූපාවචර භූමිවල, නැවත මේ රූපාවචර ධ්‍යාන උපදවා ගන්නේ නැහැ ඒ අය. මොකද, ඒ රූපාවචර ධ්‍යාන කියලා කියන්නේ අරූපාවචර සිත්වලට වඩා පහත් කොටසක්. ඒ නිසා, ඒවා නැවත උපදවා ගන්න උත්සාහවත් වෙන්නේ නැහැ.

අරූපයේ ඉන්න අය, ඒ තමන් ලබපු ධ්‍යානය ලබලා විපාකයක් වශයෙන් අරූප ලෝකයේ ඉපදුණා නම්, ඒ අරූප භූමියේ චුත වෙන කොට, ඒ ආයුෂ ඉවර වෙලා චුත වීමේ දී, නැවත එන්නේ කාම ලෝකයට යි. කාම සුගතියට තමයි එන්නේ. රූප ලෝකයේ උපදින්නේ නැහැ. කාම සුගතියේ, දිව්‍ය ලෝකයේ හෝ මනුස්ස ලෝකයේ. සතර අපායට කෙළින්ම වැටෙන්නෙත් නැහැ.

එහෙම නැත්නම් එයාට ඒ භූමියේ ම නැවත උපදින්න ඕන නම්, ඒ අරූප භූමියේ ඉඳිද්දීම, අර කියන කාමාවචර කුසල් සිත් තුළින්, එයා නැවත පරිකර්ම කරලා, අරූපාවචර එක්කෝ පළවෙනි ධ්‍යානය හෝ දෙවැනි, තුන්වැනි ධ්‍යාන උපදවා ගන්නවා. එහෙම උපදවා ගත්තොත්, ඒ බ්‍රහ්ම ලෝකයේ ආයුෂ අවසන් වුනාම, නැවත ඒ බ්‍රහ්ම ලෝකයේ ම උපදින්න පුළුවන්.

එහෙම නැති වුනොත්, කෙළින්ම කාම ලෝකයේ, මනුස්ස ලෝකයේ හෝ දිව්‍ය ලෝකයේ තැන්වල තමයි උපදින්නේ.

එතකොට, ඒ ලෝක වලත්, කාමාවචර සිත් පහල වෙනවා කියලා, මා කතා කළා. නමුත් ඒ අරූපාවචර බ්‍රහ්මයෝ අර රූපාවචර බ්‍රහ්මයන් වගේ ධර්ම සාකච්ඡා කිරීම් හා මනුස්ස ලෝකයට පැමිණීම වගේ මේ දේවල්, අරූපාවචර බ්‍රහ්මයන් අතින් වෙන්නේ නැහැ. මොකද, රූපය නැති නිසා, ඒ අරූපාවචර ලෝකවල සත්වයෝ, ඒ ඒ භූමිවල හැසිරෙන්නේ හෝ ඒ ඒ සිත් උපදවා ගන්නේ නැහැ.

කාමාවචර සිත් නමුත් උපදිනවා, ඒ අයට ඒ ධ්‍යාන නිකාන්ති වශයෙන්, තණ්හා වශයෙන් ඇතිවෙන කාමාවචර සිත්. ඊට අමතරව මේ වගේ තමන් ඉහල ධ්‍යාන ලබාගන්න පරිකර්ම කරන්නේ, කාමාවචර කුසල් සිත් වලින් තමයි ඒ පරිකර්ම කරමින් ඉහළ ධ්‍යාන ලබාගන්නේ.

ඒ වාගේම, අවසාන මොහොතෙත් එයාට ප්‍රතිසන්ධි වශයෙන්

පහල වෙන්නත් වෙන අරූපාවචර ධ්‍යාන උපදවා ගත්තේ නැත්නම්, අනිවාර්‍යයෙන් එයාට කාමාවචර සිතක් පහල වෙනවා.

ඒ නිසා, ඒ භූමියෙත් කාමාවචර සිත් පහල වෙන්න පුළුවන් කියන එක අපි විශ්වාසයෙන් තේරුම් ගන්න ඕන.

ඉතින් ඕක තමයි, ඒ භූමියේ ස්වභාවය. ඒ ධ්‍යානය උපදින ආකාරය ඒ පටිච්චසමුප්පාදය ගත්තහම, ඒ පළවෙනි අරූපාවචර සිත තමයි **ආකාසානාචඤ්චායතන** කුසල් සිත කියන එක.

ඒ කුසල් සිත උපදවා ගන්නේ, අපි අර දස කසිනය ගත්තහම, කසිනයෙන් ආකාස කසිනය හැර, අනිත් කසිනයන්ගෙන් අරමුණ අර ගෙන, එහි කසිනය උගුලුවලා, අපි කියමු පඨවිය කියන එක. පඨවිය අරමුණු කරමින් නම් ප්‍රථමධ්‍යානය ලබාගත්තේ රූපාවචර, ඒ චතුත්ථධ්‍යානය දක්වා දියුණු කරපු කෙනෙක්, එතනින් එහා ඒ පඨවි ආරම්මණය උගුලුවලා හිස් බව, ආකාශය අරමුණු කරනවා. එයාට රූප නිමිත්තක් අරමුණු වෙන්නේ නැහැ. **අනන්තො ආකාසො, අනන්තො ආකාසො** කියලා, රූප නිමිති මෙනෙහි නො කර, අර අනන්තවූ ආකාසයේ හිස් බව තමයි අරමුණු කරන්නේ. ඒකට කියනවා, **කටිනුග්ගාසන ආකාස** කියලා.

මේවා අපට භාවනා වශයෙන් විශේෂ වැදගත් දේවල් නෙවෙයි. නමුත් මේවා අපි ධර්මය දැන ගෙන සිටීමට අවබෝධය සඳහා කියන තොරතුරු ටිකක්.

එතකොට ඒ විදියට, පරිකර්ම කරලා තමයි, **අරූපාවචර ප්‍රථමධ්‍යාන** කුසල් සිත උපදවා ගන්නේ.

එතකොට ඒකේ අපි ඒකක්ෂණික පටිච්චසමුප්පාදය ගත්තහම, ඒ සිත උපදින්නේ කොහොමද කියලා, හට ගන්න ආකාරය

විස්තර කරන කොට, අර වගේ ම තමයි, ***කුසලමූලපච්චයා සඞ්ඛාරා*** කියලා තමයි, ඒ කුසල් සිත හඳුන්වන්නේ.

***කුසලමූලපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමං, නාමපච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා පසාදො, පසාදපච්චයා අධිමොක්ඛො, අධිමොක්ඛපච්චයා භවො*** කියලා, මේ විදියට අර පටිච්චසමුප්පාදය සිද්ධ වෙනවා.

හැබැයි, මෙකේ විශේෂයක් තියෙනවා, අර නය ක්‍රම හතරෙන්, ***විඤ්ඤාණපච්චයා නාමං. විඤ්ඤාණපච්චයා නාමරූපං*** කියාපු නය ලැබෙන්නෙත් නැහැ, ***නාමරූපපච්චයා සළායතනං*** කියාපු නය ලැබෙන්නෙත් නැහැ.

එතකොට, තුන්වැනි හතරවැනි නය ක්‍රම දෙක ලැබෙන්නේ නැත්තේ, තුන්වැනි හතරවැනි නය ක්‍රම තියෙන්නේ, රූපය සමග පහල වෙන භූමිවල නය ක්‍රම යි.

***විඤ්ඤාණපච්චයා නාමරූපං*** කියලා තියෙන තැන්වල මේ නය ක්‍රමයේ දී, මේ අරූප ලෝකයේ රූප නැහැ කියන්න අන්න ඒවත් ඉතාමත් වැදගත් සාක්ෂි. එතකොට ඒ නය ක්‍රමයේ දී, ***විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා ඵස්සො, නාමරූපපච්චයා ඡට්ඨායතනං*** කියන මේ නය ලැබෙන්නේ නැහැ. අර සළායතන නය ලැබෙන්නෙත් නැහැ, මොකද, රූපය නැති නිසා. ඒ නය ක්‍රම දෙකයි පහල වෙන්නේ.

අර මුලින් කියපු නය ක්‍රම දෙක, ***විඤ්ඤාණපච්චයා නාමං, නාම ඵස්සො*** කියපු මේ නය ක්‍රම දෙක පමණයි මේ අරූප භූමියේ දී ලැබෙන්නේ. ඒක තමයි මෙහි විශේෂත්වය. ඊට අමතරව වෙනත් විශේෂත්වයක් නැහැ, මෙකේ.

වේදනාව කියන තැන හැම වෙලාවේ ම, අර **සොමනස්ස**

**වේදනාව** නැහැ. මේ ධ්‍යාන හතර ම උපේක්ෂා වේදනාවෙන් යුක්තයි. ඒ නිසා හැම වෙලාවේ ම මෙහි වේදනාව ***උපෙක්ඛා වේදනාව*** තමයි ගන්නේ.

***වෙදනාපච්චයා පසාදො*** කියන එක ඒ විදියට ම ලැබෙනවා. ***පසාදපච්චයා අධිමොක්ඛො*** කියන එක මේ ධ්‍යානයට අනුරූපව ලැබෙනවා. ***අධිමොක්ඛපච්චයා භවො*** කියලා කියන කොට, **භවය** කියන්නේ, ඒ මොහොතේ පහල වෙන **වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ** කියන ස්කන්ධයන්ගේ පහල වීම යි භව. ***භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං*** කියලා, අරූපාවචර සිත් ටිකත් ඒ විදියට විස්තර කරනවා.

එතකොට, ඒ අරූපාවචර **කුසල් සිත්** වගේමයි, **විපාක** ක්‍රියා **සිතුත්.** අරූපාවචර **ක්‍රියා සිත් අරූපාවචර විපාක සිතුත්**. ඒ විදියට, හතර හතර තියෙනවා. ඔක්කොම දොළහ ක් තියෙනවා.

එතකොට, එහි අරූපාවචර ලෝකයේ ඉන්න බ්‍රහ්මයෝ, ඒ ලෝකයට සෝවාන් වෙලා ගියොත් එහි ධ්‍යාන ලබලා, අරහත්භාවයට පත් වුනොත්, ඒ රහතන්වහන්සේලාට, ඒ අරූපාවචර ක්‍රියා ධ්‍යාන තමයි උපදින්නේ.

එතකොට, ඒ ධ්‍යානයත් අර විදියට ම පටන් ගන්න කොට, ***කුසලමූලපච්චයා*** කියලා පටන් ගන්නේ නැතුව, ***සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං*** කියලා තමයි පටන් ගන්නේ. ඒ ඔක්කෝම සහේතුක සිත්. අනිත් අංගවල කිසිදු වෙනසක් නැහැ. අර කියපු අවසාන නය ක්‍රම දෙක ලැබෙන්නේ නැහැ, එකකවත්. එච්චරයි වෙනස.

විපාක සිත් ගත්තාමත් ඒ විදිය තමයි. මේ යට ක්‍රමවල ලැබෙන ***කුසලමූලපච්චයා සඞ්ඛාරා*** කියලා ඒ විදියට කියන්නේ නැහැ, විපාක සිතේත්. මොකද, ඒවා කුසල් සිතක් නොවෙන නිසා.

***සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං*** කියලා තමයි, විපාක සිතත් පටන් ගන්නේ පටිච්චසමුප්පාදයේ.

**ඔය ටික තමයි, අරූපාවචර කුසල විපාක, ක්‍රියා සිත්වල ස්වභාවය.**

දැන් ඔබ අරූපාවචර ලෝකය පිළිබඳ නො දන්නා කරුණු රැසක් ඉගන ගත්තා. ඒ භූමිය පිළිබඳව ඒ භූමි වශයෙන් හතර යි තියෙන්නේ. ස්කන්ධ වශයෙන් හතර යි. ආයතන දෙක යි. ධාතු දෙක යි. සත්‍ය වශයෙන් ගත්තහම, සත්‍ය තුන ක් පහල වෙන්න පුළුවන්. ආහාර තුන ක් පහල වෙන්න පුළුවන්.

හැබැයි අර කතා කරපු වගේ පරියාපන්න, අපරියාපන්න එකකුත් තියෙනවා. ඒ අරූප භූමියට අදාළ ම ධර්ම අපි ගන්න ගියොත්, ඇහිඳින්න ගියොත්, ඒ වගේ අපි ගත්තහම ස්කන්ධ වශයෙන් හතර ම තියෙනවා. ඒ අරූපාවචර භූමියට අදාළ ධර්ම හැටියට හඳුන්වන්නේ මොනවා ද? අර කියපු අරූපාවචර කුසල් සිත් හතර යි, විපාක සිත් හතර යි, ක්‍රියා සිත් හතර යි.

එතකොට, මේවාගෙන් අපි ඉස්සර වෙලා කතා කළේ, ස්කන්ධ ධාතු ආයතන වශයෙන් අරූප ලෝකයේ පහල වෙන්න පුළුවන්, වෙන භූමියට අයිති දේවලුත්. නමුත්, අරූපාවචර භූමියට ම අදාළ ස්කන්ධ හතර යි, ආයතන වශයෙන් දෙක යි, ධාතු වශයෙන් දෙක යි, ඒ භූමියට ආවේණික. සත්‍ය වශයෙන් එක සත්‍යයයි, දුක්ඛ සත්‍යය විතරයි. ගත්තහම ආහාර වශයෙන් හතර යි.

ඊට පස්සේ, ඊට අමතරව හේතු වශයෙන් ගත්තහම, ඒ අරූප ලෝකයේ හේතු ගත්තහම හේතු හයයි. ඒ භූමියට අදාළ හේතු හය යි. මොකද, අකුසල හේතු ටික ඒ භූමියට අදාලව කියන්නේ නැහැ නේ. කාමාවචර ධර්මයක් නේ අකුසල හේතු

ටික. ඒ භූමියේ පහල වෙන්න පුළුවන් වුනාට, ඒ භූමියට අදාළ ධර්මයෝ කතා කරන කොට, හේතු වශයෙන් **අලෝභ, අදෝස, අමෝහ** ටික විතරයි.

**අව්‍යාකත අලෝභ අදෝස, අමෝහයි, කුසල අලෝභ අදෝස, අමෝහයි** කියන හය තමයි හේතු වශයෙන් පහල වෙන්නේ.

ඔය ටික තමයි, අරූප භූමිය පිළිබඳ තොරතුරු. මේකේ ඔබ ග්‍රහණය නොවුනු තැන්, දේශනාව අහලා, හොඳට ශ්‍රවණය කරලා, මේ කොටස් කොටස් මා කතා කළේ, මේ භූමි ගැන විස්තර කර නිසා.

අද දවසේ ඒ නිසා අර අපි විදර්ශනාවක් වශයෙන් ක්‍රමානුකූලව පෙළකට කතා වෙන ඒ විස්තරයක් නෙවෙයි දේශනාවක් නෙවෙයි අද කළේ. මේ දේශනා වාරයට අදාලව, ඒ භූමි පිළිබඳ විස්තර ටිකක් තමයි කතා කළේ.

**එතකොට, ඒ අරූපාවචර සිත් පිළිබඳව යි.**

ඊට පස්සේ **ලෝකෝත්තර සිත්**. ලෝකෝත්තර සිතුත් හඳුන්වන්නේ, මේ ධර්මයේ හඳුන්වලා තියෙන්නේ ධ්‍යාන වලට අනුරූපව. ප්‍රථමධ්‍යානය ලබාගත්තු කෙනෙක්, ඒ ප්‍රථමධ්‍යානයෙන් නැගිටලා, ඒ ප්‍රථම ධ්‍යානයේ අංග අරමුණු කරලා, ඒ අංග **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** වශයෙන් මෙනෙහි කරමින්, ඒ විදියට **ලෝකෝත්තර ධ්‍යාන** ලබා ගන්නවා.

ඒක හඳුන්වලා තියෙන්නේ, ***කථමෙ ධම්මා කුසලාඃ යස්මිං සමයෙ*** -පෙ- ***ලොකුත්තරං ඣානං භාවෙති නියානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා.*** **පඨමාය භූමියා** කිව්වේ, සෝවාන් ඵලයට පත්වීම සඳහා, ප්‍රථම භූමියට පත්වීම සඳහා, ***විවිච්චෙව කාමෙහි -පෙ- විවිච්ඡ අකුසලේහි ධම්මෙහි පඨමඣානං*** උපසම්පජ්ජ විහරති ***දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං.*** එතකොට, ප්‍රතිපදා හතරෙනුත්

මේක නම් කරලා තියෙනවා.

ප්‍රතිපදා හතරක් තියෙනවා, ඔබ දන්නවා, ***දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා***. ඇතැම් අයගේ ප්‍රතිපදාව බොහොම දුක් සහගතයි. අවබෝධ වෙන්නේත් බොහොම හෙමින්. ඒ නිසා කියනවා, ***දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා*** කියලා. අවබෝධ වෙන්නේත් හෙමිහිට යි, ඉන්ද්‍රිය ධර්මයන් දියුණු නැති නිසා.

ඇතැම් අය ඉන්නවා, ප්‍රතිපදාව දුක් සහිතයි. බොහොම දුකසේ තමයි එයා පුරන්නේ. මොකද, එයාට සමාධිය අඩුයි. විදර්ශනාවෙන් තමයි එයා ප්‍රතිපදාව පුරන්නේ. බොහෝ අයගේ අර තණ්හා චරිත කියන අයගේ ප්‍රතිපදාව බොහෝ සෙයින් දුකයි. දිට්ඨි චරිත කෙනාගෙත් තියෙනවා එහෙම.

***දන්ධාභිඤ්ඤා*** කියනවා ඇතැම් අයගේ ප්‍රතිපදාව දුක් සහගත වුනාම, අවබෝධය ***ඛිප්පාභිඤ්ඤා***. වහා අවබෝධ විමට හැකියාව තියෙන අයත් ඉන්නවා.

ඒ නිසා, මේ ප්‍රතිපදා දෙකට අනුරූපව ලෝකෝත්තර සිත් විස්තර කරලා තියෙනවා. එතකොට ඒ විදියට, ලෝකෝත්තර සිත් අපි සාමාන්‍යයෙන් දන්නවා කුසල් සිත් හතර යි, විපාක සිත් හතර යි, ඵල සිත් හතර යි කියලා.

නමුත් මේ ධ්‍යාන භේදයට ගත්තහම, ලෝකොත්තර සිත් හතළිහ ක් හැටියට පෙන්වලා තියෙනවා.

දැන් ප්‍රථමධ්‍යාන සිත ගත්තොත්, ප්‍රථමධ්‍යාන සිතෙන්, සෝවාන් මාර්ග සිත, සකෘදාගාමී මාර්ග සිත, අනාගාමී මාර්ග සිත, අර්හත් මාර්ග සිත කියන හතර ම ලබන්න පුළුවන්. ඒකට අනුව, සෝවාන් ඵල සිත, සකෘදාගාමී ඵල සිත, අනාගාමී ඵල සිත, අර්හත් ඵල සිත කියන හතරම ලැබෙනවා. එතකොට, එක

ධ්‍යානයකින්, මේ ලෝකෝත්තර කුසල්, ඵල විපාක අට ම ලබන්න පුළුවන්.

එතකොට එක ධ්‍යානයකට අට ක් තියෙනවා. ඒ විදියට ධ්‍යාන පහ ක් තියෙනවා නේ, පඤ්චමධ්‍යාන. ඒ ධ්‍යාන පහ ම ගත්තහම, ඒ ධ්‍යාන පහට එතකොට අට වරක් පහ හතළිහ ක්.

අන්න ඒ විදියට තමයි, මේ සිත් විස්තර කරන කොට. අර අති දීඝ ක්‍රමයට තමයි ලෝකෝත්තර සිත් විස්තර කරලා තියෙන්නේ.

එතකොට ඒ **ලෝකෝත්තර භූමි** ගත්තහම, ඒ ලෝකොත්තර භූමියේ ස්කන්ධ වශයෙන්, දැන් භූමියක් කියලා අපි ලෝකෝත්තර භූමිය කියලා හඳුන්වන්නේ අර කියපු කාමාවචර, රූපාවචර, අරූපාවචර ලෝක වගේ එහෙම සත්ත්වයෝ මේ නිවන් දැකලා යන්න තැනක් තියෙනවා කියන අදහසින් නෙවෙයි. මොකද ඒ දේවලුත් ඇතැම් අවස්ථාවලදී එහෙම වරදවා කියපු තැන් මට ඇහිලා තියෙනවා. මේ නිවන් දැකලා යන්න භූමියක් තියෙනවා, එහේ ඉන්නවා කියලා. එහෙම කියන එකක් එහෙම නෙවෙයි. ඒ ව්‍යවහාර කතාවේ කතා කළාට, ලෝකෝත්තර භූමිය කියලා හඳුන්වලා තියෙන්නේ, ඒ ලෝකෝත්තර ධර්මයන් තමයි භූමිය හැටියට හඳුන්වලා තියෙන්නේ. එහෙම මිසක් මේ රූපාවචර, අරූපාවචර භූමි වගේ, සත්වයෝ වාසය කරන වෙනම භූමියක් තියෙනවා කියන අදහසින් නෙවෙයි.

එතකොට, ඒ අර ලෝකෝත්තර සිත් ගත්තහම, ඒ ලෝකෝත්තර සිත් වලට අදාළ ස්කන්ධ හතර යි.

**රූපස්කන්ධය ලෝකෝත්තර නෙවෙයි**. එතකොට, **වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ** ගත්තහම, ඒවා, රූපාවචර ද

වෙනවා, කාමාවචර ද වෙනවා, අරූපාවචර ද වෙනවා, ලෝකෝත්තර ද වෙනවා.

නමුත් **ලෝකෝත්තර ද** ස්කන්ධ හතර නිසා, ස්කන්ධ හතර යි.

ආයතන වශයෙන් හැම වෙලාවේ ම, ධම්මායතනයයි, මනායතනයයි, තමයි ආයතන වශයෙන් තියෙන්නේ.

නමුත්, එහි දී **ආයතන** ගත්තහම, පරියාපන්න හැම වෙලාවේ ම, පරියාපන්න ධර්මයෝ ගත්තහම ධම්මායතනයයි, මනායතනයයි දෙක එකතු වෙලා තමයි ඒක සිද්ධ වෙන්නේ.

එතකොට **ධාතු** වශයෙන් ගත්තහම, මනොවිඤ්ඤාණ ධාතුවයි, ධම්ම ධාතුවයි.

**ආහාර** වශයෙන් ගත්තහම, ආහාර හතර ම අයිති වෙනවා, ලෝකෝත්තර භූමියට. ඵස්ස ආහාරය, මනොසංචෙතනා ආහාරය, විඤ්ඤාණ ආහාරය, වශයෙන්.

**හේතු** වශයෙන් ගත්තහම, හේතු හය ක් සඳහන් වෙනවා. කුසල හේතු තුන යි, විපාක හේතු තුන යි. ඕවා තමයි විශේෂ.

ඊට පස්සේ, මේ පටිච්චසමුප්පාදය දිහා බැලුවා ම, පටිච්චසමුප්පාදයේ කුසල් සිත පටන් ගන්න කොට, ඒත් පටන් ගන්නේ මේ කියන, ***කුසලමූලපච්චයා සඞ්ඛාරො*** කියලා පටන් ගන්නේ. ***සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමං, නාමපච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා පසාදො, පසාදපච්චයා අධිමොක්ඛො, අධිමොක්ඛපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං*** කියලා හඳුන්වලා, අවසානයට, ***එවමෙතස්ස ධම්මානං සමුදයො හොති*** කියලා තමයි තියෙන්නේ.

අනිත් ඔක්කොගේම තියෙන්නේ මොනවා ද? ***එවමෙතස්ස***

***දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.*** මෙතන තියෙන්නේ ***ධම්මානං සමුදයො හොති.*** මොකද, ***දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති*** කියලා, ලෝකෝත්තර සිත්වලට මේ දුක් රැස හට ගන්නවා කියලා කියන්න බැහැ නේ.

ඒ නිසා, මෙසේ මේ **ධර්මයන්ගේ** පහල වීම වෙනවා කියලා, ලෝකෝත්තර සිත් විග්‍රහ කරන කොට සඳහන් කරනවා.

එච්චරයි මේ ලෝකෝත්තර කුසල් සිත්වල වෙනස. හැබැයි, ඒවාගේ ආරම්මණයේ වෙනසක් තියෙනවා.

අර අපි **ලෞකික සිත්වල හැම වෙලාවේ ම අරමුණ වෙන්නේ,** මොකක්ද? **ලෞකික ධර්මයක්, සංඛත ධර්මයක්**. ඒ ධ්‍යානයට අදාලව හෝ විදර්ශනාවට අදාලව හෝ රූපාවචර, අරූපාවචර කොයි දේ ගත්තත්, ඒ සංඛත ධර්ම තමයි ඒවාට අරමුණු වෙලා තියෙන්නේ. මෙතෙක් අපි කතා කරපු විදියට.

**හැබැයි, ලෝකෝත්තර සිත්, විපාක හා කුසල් සිත් හැම එකක ම අරමුණ, නිර්වානය තමයි අරමුණ වෙන්නේ.**

**ලෝකයේ කිසිවක්, සංඛත කිසිවක් අරමුණු නොවන නිසා, අසංඛත වූ නිවන තමයි මේ ලෝකෝත්තර සිත්** අට ට ම, **අරමුණු වෙලා තියෙන්නේ**.

ඒ ආරම්මණය වෙනස් හා ඊට පස්සේ මේ කියන කුසල මූලයන්ගේ, විඤ්ඤාණයන්ගේ, නාමයන්ගේ, ෂට්ඨායතන මේ ඔක්කොගෙන්ම, ඒ ධ්‍යාන, ඒ කියන ලෝකෝත්තර සිතට අදාලව තමයි අපි කතා කරන්නේ.

එතකොට මෙතැන ***කුසලමූලපච්චයා*** කියලා කිව්වාම, ඒ ප්‍රථමධ්‍යාන සෝවාන් මාර්ග සිතේ තියෙන **අලෝභ, අද්වේශ, අමෝහ** තමයි, කුසල මූල වෙන්නේ.

***සංඛාරය*** කිව්වාම ඒ නිර්වාණය අරමුණු කිරීම් වශයෙන්

උපදින සඞ්ඛාරය. ***විඤ්ඤාණය*** කිව්වාම, ඒ ලෝකෝත්තර ප්‍රථමධ්‍යානවූ සෝවාන් මාර්ග සිත තමයි, මේ ***විඤ්ඤාණය*** හැටියට ගන්නේ. එතකොට, ***ෂඩායතනය*** ගත්තාමත්, ඒ විදියට. ***වේදනාව*** ගත්තාමත්, ඒ ධ්‍යානයට අදාලවයි වේදනාව ගත යුත්තේ.

දැන් අපි කියමුකො, ප්‍රථම ධ්‍යානයට අනුව නම් පළවෙනි මාර්ග සිත උපදවා ගත්තේ, වේදනාව සොමනස්ස වේදනාවක්. උපෙකඛා වේදනාව අයිති ධ්‍යානවල වේදනාව උපේක්ඛා වේදනාව විතර යි.

ඊට අමතරව, මේ ***පසාදො, අධිමොක්ඛො*** කියන ඒවත්, ඒ විදියට ම ලෝකෝත්තර සිත්වල ලැබෙනවා. වෙනස තියෙන්නේ, ඒ ලෝකෝත්තර සිතට අදාලව තමයි අපි සලකා ගන්න ඕන.

ඊට පස්සේ, ලෝකෝත්තර විපාක සිත් ගත්තහම, ඒ විපාක සිත් ඒ ලෝකෝත්තර කුසලයට අනුරූපව තමයි ඒ මොහොතේ ම විපාකය ලැබෙන්නේ. ඒකයි, මෙතන වෙන වෙනස.

දැන් අර කියපු, අපි මුලින් කතා කරපු රූපාවචර, අරූපාවචර විපාක සිත් ඒ මොහොතේ පහල වෙනවා නෙවෙයි. ඒ ඒ කුසලයට අනුරූප ව, ඒ ඒ කුසලයෙන් නො පිරිහී හිටියොත්, අවසාන මොහොතේ, කාලක්‍රියා කිරීමෙන් පසු, ඒ වෙනත් භූමියක, ඒ කුසලයට අනුරූපී ව ඒ ඒ භූමිවල පහල වෙනවා.

හැබැයි, **ලෝකෝත්තර සිත**, මාර්ග සිත් වශයෙන්, කුසල් සිත් එකයි එකවර හට ගන්නේ. බොහෝ හට ගන්නේ නැහැ. ඒ සෝවාන් මාර්ග සිතට අනතුරුව ම, සෝවාන් ඵල සිත උපදිනවා. ඒකේ කවදාවත්, අර ඒ වගේ අර කාලයක් ගත වෙන්නේ නැහැ. ඒකට අනතුරුව ම විපාක සිත පහල වෙනවා.

විපාක සිත් කොතෙකුත් පහල වෙන්න පුළුවන්. හැබැයි,

එකවර, එක් කෙනෙකුට, ලෝකෝත්තර කුසල් සිත් එකයි පහල වෙන්නේ.

එතකොට **එක සත්වයෙකුට, ලෝකෝත්තර කුසල් සිත් හතර යි පහල වෙන්නේ, හතර වරක දී.** එච්චර යි. බොහෝ පහල වෙන්නේ නැහැ. විපාක සිත්, අපට සමාපත්ති වශයෙන්, විපාක සිත් පහල වෙන්න පුළුවන්.

එතකොට ලෝකෝත්තර ක්‍රියා සිත් කියලා කොටසක් නැහැ. මොකද, ඒ **ක්‍රියා සිත්, හැම වෙලාවේ ම ලෞකිකයි**. ඒ නිසා ක්‍රියා සිත්වල අරමුණ හැම වෙලාවේ ම ලෞකික ධර්මයක්.

එතකොට රහතන්වහන්සේ නමකටත්, ඒ ඒ භූමිවල, ඒ ඒ ක්‍රියා ධර්මයෝ සිද්ධ කරන්න අවශ්‍යයි. පිරිනිවන්පානකම් ජීවත් වෙන්න අවශ්‍යයි. ඒ නිසා, ඒ ඒ භූමිවල, ඒ ක්‍රියා සිත් රහතන්වහන්සේලාට පහල වෙනවා. හැබැයි, උන්වහන්සේලා දිට්ඨධම්ම සුඛවිහරණය සඳහා ඵල සමාපත්තිවලට සම වදින කොට, එතකොට නැවත අර කියපු ලෝකෝත්තර අරමුණ වෙන, නිර්වාණය අරමුණු කර ගෙන ඵල සිත් වශයෙන් කෙනෙකුත් පහල වෙන්න පුළුවන්, එතකොට විපාක වශයෙන්.

එතකොට, ඒ ලෝකෝත්තර විපාක සිත් ගත්තහම, පටිච්චසමුප්පාදයේ අර කියපු ඒක ක්ෂණික පටිච්චසමුප්පාදය ගත්තහම, එතනදී අර **කුසලමූලපච්චයා සඞ්ඛාරො** කියලා පටන් ගන්නේ නැහැ. ඒ ලෝකෝත්තර විපාක සිත් පටන් ගන්නේත්, ***සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං*** කියලා. ***සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමං, නාමපච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා පසාදො, පසාදපච්චයා අධිමොක්ඛො*** කියලා, මේ විදියට තමයි ලෝකෝත්තර විපාක සිත් පහල වෙන්නේ. වෙනස, **කුසලමූලපච්චයා** කියලා සඳහන් වෙලා නැහැ. ඒ වෙනුවට, ***සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං*** කියලා තමයි

සඳහන් වෙලා තියෙන්නේ, ලෝකෝත්තර විපාක සිත්වල.

ඉතින් ඔය ටික තමයි අපට ලෝකෝත්තර භූමිය ගැන කතා කරන්න තියෙන විශේෂ තොරතුරු, මේ පටිච්චසමුප්පාදයට අනුකූලව.

එතකොට, අපි ආපහු කෙටි සංකලනයක් කළොත්, ලෝකෝත්තර සිත් කියන දේවල් විශේෂයි. ඒ දේවල් අරමුණ වෙනස්. ඒ ලෝකෝත්තර සිත් හැම භූමියක ම පහල වෙන්න පුළුවන්.

හැබැයි, ලෝකෝත්තර සිත් වලින් පළවෙනි සෝවාන් මාර්ග සිත අරූපාවචර ලෝකයේ පහල වෙන්නේ නැහැ. ඉතුරු මාර්ග ඵල සිත්, අරූපාවචර ලෝකයේ පහල වෙනවා.

ඒ ලෝකෝත්තර සියල්ලගේ ම අරමුණ, සඞ්ඛත ධර්මයක් නෙවෙයි, අසඞ්ඛත වූ නිර්වාණය යි අරමුණ වෙන්නේ. ඒවා තමයි විශේෂත්ව හැටියට හඳුන්වන්න තියෙන්නේ.

ඉතින් මෙතෙක් අපි කතා කළේ, කුසල් සිත් පිළිබඳව යි. කුසල් සිතින් මහග්ගත සිත් පිළිබඳව කතා කළා. රූපාවචර සිත්, විපාක සිත්, ක්‍රියා සිත්, අරූපාවචර විපාක සිත්, ක්‍රියා සිත්. ලෝකෝත්තර විපාක සිත් සහ කුසල් සිත් පිළිබඳව කතා කළා.

එතකොට ඒ ඔක්කොගේම වෙනස්කම් අපි කතා කළා. විශේෂ තැන් අපි කතා කළා. ස්කන්ධ, ධාතු, ආයතන පිළිබඳව, ඒ භූමිවල කතා කළා. මේවා අපේ දේශනාව අහලා, ශ්‍රවණය කරලා, නැවත නැවත ඒ පිළිබඳව දැනුම ලබාගන්න.

මීට අමතර විස්තර, මම කතා කරපුවායේ අමතර විස්තර විභංගප්‍රකරණයේ දෙවැනි පොතේ, අවසාන විභංගය, ධම්මහදය විභංගයේ, මේ කියපු ස්කන්ධ ධාතු ආයතන පිළිබඳව සවිස්තර විස්තරාත්මකව, පරියාපන්න, අපරියාපන්න භේදයෙන් සඳහන් වෙලා තියෙනවා. ඒක ඔබට බලාගන්න

පුළුවන්.

ඒවා කියවනවා නම්, විශේෂයෙන් බොහොම වටිනවා, මේ ධර්මඥානය දියුණු කර ගැනීමට, **ධම්මහදය විභංගය** විශේෂයෙන් වටිනවා. ඒ නිසා අපි පසුව ඕනෑ නම් ඒ විභඞ්ගය අර ගෙන දේශනා මාලාවක් අපි ඉදිරියේ දී පවත්වමු, අවශ්‍ය වුනොත්.

හොඳයි එහෙම නම් කාල වේලාවත් බොහෝ සෙයින් ගිහින් තියෙන නිසා මගේ දේශනාව මේ වෙලාවේ හමාර කරනවා. මේ අනුසාරයෙන් යම් යම් ගැටලු තියෙනවා නම් හෝ, පෙර දේශනාවල හෝ, ඔබගේ භාවනාවන් තුළ දහම් අවබෝධයේ දී යම් යම් ගැටලු හෝ තියෙනවා නම් ඒවා පිළිබඳව සාකච්ඡා කරන්නත් මේ කියපු, කතා කරපු දේවල් තුළ යම් ඔබට, යම් අදහසක් එකතු කරන්න තියෙනවා නම් ඒවා පිළිබඳව කතා කරන්න ඉඩ අවකාශ සලසලා මගේ ධර්මානුශාසනාව අවසන් කරනවා.

හැම දෙනාට ම තෙරුවන් සරණයි! සම්මා සම්බුදු සරණ යි!

***උත්තරණ මෙහෙණින් වහන්සේ (අපැහැදිලියි)*** :- තෙරුවන් සරණයි අපේ හාමුදුරුවනේ. මට ගිය සැරේ ප්‍රශ්නයක් ආවා, මේ කාමාවචර කුසල් සිත්වල දී මේ ඒකචිත්තක්ෂණ මාර්ග ඵලයක් කොහොම ද ඒකචිත්තක්ෂණ සිත තුළ ලබන්නේ කියලා. කියන නිසා දැන් ඔබ වහන්සේ දැන් ඒකට පිළිතුරු අද දේශනාවේ දී ලැබුණා මට. ඒ වගේ ම එතකොට අපේ හාමුදුරුවනේ රහතන් වහන්සේට ඔබ වහන්සේ කිව්වා

ඤාණවිප්‍රයුක්ත ක්‍රියා සිත් පහළ වෙනවා කියලා. ඒ කියන්නේ සාමාන්‍ය ක්‍රියාවලියවලදී ද? සාමාන්‍යයෙන් තමාගේ පරිභෝජනයේ ඒ දේවල් ක්‍රියාවලියේ බැහැ නේ ද පිණ්ඩපාතයේ යන ... ක්‍රියා සිත් පහළ වෙන ... පැහැදිලි කරන්න ... අපේ හාමුදුරුවනේ.

***ස්වාමීන් වහන්සේ*** :- ඔව්. හොඳ ප්‍රශ්නයක්. මේ ඤාණවිප්‍රයුක්ත සිත් රහතන්වහන්සේලාට පහළ වෙන බව ධර්මයේ සඳහන් වෙලා තියෙන සාමාන්‍යයෙන් ඒවා සසර පුරුදු වශයෙන් අර සවාසනා කියලා, ඒක වාසනා සහිත කෙලෙස් හැටියට ඔය හඳුන්වලා තියෙන්නේ.

- ඔය ඇතැම් රහතන්වහන්සේලා දැන් අර වසල වාදයෙන් බොහෝ බ්‍රාහ්මණ කුලවල ඉපදිලා හිටපු ඒ රහතන් වහන්සේ සාමාන්‍ය වෙලාවට 'වසලය' කියලා කතා කරපු අවස්ථා.

- ඒ වාගේ ම ඇතැම් ස්වාමීන් වහන්සේලා පිළිබඳ අපේ සඳහන් වෙලා තියෙනවා, අර වඳුරු යෝනියේ ආත්ම ගණනක් ඉපදිලා යන කොටත් අර වතුර වලවල් වලින් හෙම පැන ගෙන ගිහිල්ලා තියෙනවා.

- ඒ වාගේ ම ඇතැම් රහතන්වහන්සේලා අර තමන් ගත්තු ආහාර නැවත වමාරලා මේ ආහාරය ඒ විදියට අනුභව කරලා තියෙනවා, ගව යෝනියේ බොහෝ කාලයක් හිටපු නිසා.

ඒ වාගේ අර සංසාර පුරුදු, සවාසනා කියන කෙලෙස්වල අර ගති ස්වභාවය, කෙලෙස් ඉවර වුනත් ඒ කෙලෙස් ගත පුරුද්ද රහතන්වහන්සේලා ගාවත් ඒ පැවැතීම නිසා අන්න ඒ වාගේ අවස්ථාවලදී ඤානවිප්පයුත්ත ක්‍රියා සිත් රහතන්වහන්සේලාටත් පහළ වෙන්න පුළුවන්.

ඒ වාගේ ම සිනා පහල කිරීම, හසිතුප්පාද සිත් ගත්තහම රහතන්වහන්සේලාට පමණ යි. ඒ ක්‍රියා සිතත් අහේතුක ක්‍රියා සිතක්. ඒවාත් ඥානවිප්‍රයුක්ත ක්‍රියා සිතක්. එතකොට අන්න ඒ වාගේ මේ රහතන්වහන්සේලාටත් මේ ඥානවිප්‍රයුක්තව සිත් පහල වෙන්න පුළුවන්. නමුත් ඒ සතිය අඛණ්ඩව පවතිනවා. සිහිය, ඥානය නැති වුනාට සතිය හැම වෙලාවේ ම, හැම සිතක ම හැම සිතක ම යෙදිලා තියෙනවා. නුවණ ඇති නැතිකම වෙනසක් තියෙනවා. හැබැයි බුදුරජාණන් වහන්සේට අර සවාසනා කෙලෙස් නැති නිසා උන්වහන්සේට ඤාණවිප්පයුත්ත සිත් පහල වන්නේ නැහැ කියලා අටුවා ග්‍රන්ථවල සඳහන් වෙලා තියෙනවා. තෙරුවන් සරණයි.

***දීපිකා අමුණුගම මහත්මිය*** :- තෙරුවන් සරණ යි. ස්වාමීන් වහන්ස, ගිය සතියේ ඇසූ ප්‍රශ්නයක් තිබුණා ඒක මම හිතන්නේ ... ඔබ වහන්සේ විස්තර කරපුවා මම හිතන්නේ ඒක මට නිරාකරණය වුනා කියලා යි. ඒක හරිද කියලා බලන්න මම චුට්ටක් ... ස්වාමීන් වහන්ස, ... ඤාණසම්පයුක්ත අසංඛාරික සිතක ප්‍රබල යි කියලා මම අහලා තිබුණා. ... ඒ ප්‍රශ්නය ම ඇහුවා. එතකොට ස්වාමීන් වහන්ස, ... ඤාණසම්ප්‍රයුක්ත ... සිත තමයි ප්‍රබල කියලා ඔබ වහන්සේ ... දැන් මේ ... කියන කොට ... විතක්ක විචාර ... ඒකග්ගතා කියන ඒක ප්‍රථම ධ්‍යානයේ දී ... එතකොට අර එහාට යන කොට චතුත්ථධ්‍යානයේ ... අකුසල් ... එතකොට ඒ උපේක්ෂාව කියන තැන ප්‍රබල යි කියන එක අද මට දැනුණා. ... ස්වාමීන් වහන්ස,

***ස්වාමීන් වහන්සේ***:- හරි. ඒක ඔබ තුමිය තේරුම් ගත්ත විදිය හරි. ධ්‍යාන ඉදිරියට ඉදිරියට යන කොට, විශේෂයෙන් ගත්තහම අරූපාවචර සිත් ගත්තහම සියල්ලම උපේක්ෂා

සහගත යි. ඉතින් ඒ නිසා කුසල් වශයෙන් ගත්තහම කුසල් සිත්වල උපෙක්ෂා සහගත සිත් තමයි ප්‍රබල සිත් වෙන්නේ. අර මම කතා කරේ, අපි සාමාන්‍යයෙන් කාමාවචර සිත් විතරක් ගත්තොත්, කාමාවචර සිත්වල සාමාන්‍යයෙන් අර ඉන්ද්‍රිය ධර්මයන් දියුණු නැති ආධුනික කෙනා, එයාට ගත්තොත් අපි අර **සතුටින් කරන කුසලය, අර උපේක්ෂාවෙන් කරන කුසලයට වඩා ප්‍රබල යි** කියලා හඳුන්වනවා. පටලා ගන්න එපා. ඒක සාමාන්‍යයෙන් අපි ගත්තහම මොකද අර එයාගේ ඇතැම් අයගේ උපේක්ෂාවත් තියෙනවා. ඒක අර රූපය නො ඉක්මවා අර නුවණින් යුක්ත නැති උපේක්ෂාව. ඒ නිසා මෙතැන උපේක්ෂාව කියන එක හැම වෙලාවේ ම නුවණින් යුක්ත වූ උපේක්ෂාව යි. අන්න ඒ නිසා තමයි මේ උපේක්ෂාව ප්‍රබල යි කියලා හඳුන්වලා තියෙන්නේ. ඒ නිසා ඒකේ, ඔබතුමිය කිව්වා වාගේ මේ ඒකේ වරදක් නැහැ. උපේක්ෂා වේදනාව තමයි ඉහළ ඉහළ යන කොට තියෙන්නේ. ඒ නිසා අනිවාර්යයෙන් ඒ කුසල් සිත්, ප්‍රබල කුසල් සිත් හැම වෙලාවේ ම උපේක්ෂා සහගත යි. තෙරුවන් සරණයි.

***රෝසී මහත්මිය***:- තෙරුවන් සරණ යි, ගරු ස්වාමීන් වහන්ස, මට ප්‍රශ්න දෙකක් තියෙනවා. දැන් ස්වාමීන් වහන්ස, අපි සමථ කමටහනකින් භාවනා කරන කොට ඇතිවන විතක්ක විචාර ... එක විදර්ශනා භාවනාව කරන කොට ඇතිවන සතිය, සම්පජඤ්ඤය කියන එකට සසඳන්න පුළුවන් ද ස්වාමීන් වහන්ස?

***ස්වාමීන් වහන්සේ***:- ඔව්. ඒ ඔක්කෝම එකට තමයි හට ගන්නේ. නමුත් සතිසම්පජඤ්ඤයේ සතිය කියන කොට වෙනම ධර්මයක්, සති චෛතසිකය. සම්පජඤ්ඤය කියන

කොට ප්‍රඥා චෛතසිකය යි. නුවණ. විතක්කය විචාරය කියන කොට, ඒ එතැන හඳුන්වලා තියෙන්නේ සංඛාරස්කන්ධය වශයෙන් ගත්තොත්, එතැන වෙනම ධර්ම ටිකක් තියෙන්නේ.

- අරමුණට නැංවීම වශයෙන් උපදින සිතක් තමයි විතක්කය කියලා කියන්නේ.
- ඒ නංවාපු අරමුණේ හැසිරීම වශයෙන් පහල වන සිතක් තමයි විචාරය කියලා කියන්නේ.

හැබැයි මේ විතක්ක විචාර සහිත සිත්වල, ඒ සිතෙන් සති සම්පජඤ්ඤය තියෙන්න පුළුවන්. සිහි නුවණ තියෙන්න පුළුවන්. හැබැයි, මේ සතිය විතරක් තිබිලා, නුවණ නැතුව විතක්ක විචාර  ඇතුවත් පහල වෙන්න පුළුවන්. එතකොට අපි අර ඔබතුමිය කතා කර ඒ විදර්ශනාව ගැන කතා කරන කොට, විදර්ශනාවේ අපි සමාධිය පැත්තකින් තිබ්බොත්, මේ විතක්ක විචාර අත්‍යාවශ්‍යයි. විශේෂයෙන් මේ විදර්ශනාවලදී අත්‍යාවශ්‍යයි.

ඒ ධ්‍යාන නො ලබපු අයට ඒ අරමුණේ අත නො හැර පවත්වන්න නම් අනිවාර්යයෙන් අර විතක්ක විචාර අවශ්‍ය යි. ඒ නිසා ඒ ඒ අරමුණේ බලන දේවල්, පරමාර්ථ ධර්මයන් බලන දේවල්, අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මේ දේවල් නිතර නිතර ඒ අරමුණේ අල්ලා ගෙන සම්මර්ශණය කරන්නේ ඒ විතක්ක විචාරයන්ගේ බලයෙන්. ඒ නිසා විදර්ශනාවල විශේෂ ස්ථානයක් ඒ විතක්ක විචාරයන්ට තියෙනවා.

විතක්ක විචාර ශක්තිය නැතිවුණහම තමයි  එයාගේ සිත කුසීතයට යන්නේ, එහෙම නැතිනම් එයාගේ සිත උද්ධච්චයට ගිහිල්ලා වෙන වෙන අරමුණු වලට යන්නේ මේ විතක්ක විචාරයන්ගේ ශක්තිය නැතිවුනහම යි. ඒ නිසා විශේෂයෙන් අපි දැනගන්න ඕන විදර්ශනා කරන කොට  අපි ඒක දන්නේ නැහැ මේ විතක්කය ද, විචාරය ද කියලා. නමුත් අපි හැම

වෙලාවේ ම හොඳින් අරමුණ අර ගෙන ඒ අරමුණේ ම නිතර නිතර, ඒ අරමුණ ම අරමුණු කර ගෙන, අපි කියමුකො රූපය ධාතු වශයෙන් බලනවා නම් ධාතු වශයෙන් ම සිතට ගන්න ඉඩ දෙමින් ඒ ධාතු වශයෙන් ම එය මෙනෙහි කර කර ඉන්නවා කියන මේ දේවල් විතක්ක විචාරයන්ගේ බලයෙන් තමයි සිද්ධ වෙන්නේ.

එතකොට ඒ දේවල් දුර්වල වුනොත් විපස්සනා ඥාණ දුර්වල වෙනවා. ඒ වෙනුවට නීවරණ ධර්මයන් මතු වෙලා අපේ අර කමටහනෙන් ඉවත් වෙන්න සිද්ධ වෙනවා.

***ප්‍රශ්නකරු:*** - ... ස්වාමීන් වහන්ස, යෝනිසෝමනසිකාරයේ වගේ අවස්ථාවක්. නේ ද ස්වාමීන් වහන්ස?

***ස්වාමීන් වහන්සේ:*** - අන්න හරි. අන්න හරි. යෝනිසෝමනසිකාරය වගේ අවස්ථාවක්.

***ප්‍රශ්නකරු:*** - තව එක ප්‍රශ්නයක් තියෙනවා ස්වාමීන් වහන්ස. දැන් අපි චිත්තානුපස්සනාව එහෙම නැත්නම් ධම්මානුපස්සනාව අපි වඩන කොට, අපේ ධම්මායතනයට මේ අරමුණු කරන්නේ ස්වාමීන් වහන්ස? එතකොට දැන් අනිත් ආයතනවලින් එන අරමුණු, අරමුණු කරන්නේ නැහැනේ. එතකොට අර හිතේ ඇතිවන උපේක්ෂා සහගත සමාධි ස්වභාවය අරූපාවචර සමාධි ස්වභාවයකට සමාන කරන්න පුළුවන් ද ස්වාමීන් වහන්ස?

***ස්වාමීන් වහන්සේ:*** - බැහැ. ඒක එහෙම වෙන්නේ නැහැ. අර අනිත් ආයතනවලින් අරමුණු කරන්නේ නෑ කියලා කියන්න බැහැ. අරමුණ වෙන්න පුළුවන්. හැබැයි ඒ අපි ඒකෙත් උපදින්නේ මනායතනය යි, ධම්මායතනය යි කියන ආයතන දෙක තුළ තමයි. නමුත් අරමුණු වශයෙන් අපට ධම්මායතනය යි මනායතනය යි කියලා කියන්න බැහැ.

දැන් අපි හිතමුකො, අපි චිත්තානුපස්සනාව කරන කෙනාට ශබ්දයක් ඇසීම් වශයෙන් සිතක් උපදින කොට එයා ශබ්දය අරමුණු කිරීම් ඉපදිච්ච ඒ අරමුණේ හිත පිළිබඳව බලනවා. රූපයක් අරමුණු වෙන කොට ඒ අරමුණේ චක්ඛු විඤ්ඤාණය සිත තමයි අරමුණු කරන්නේ. හැබැයි එයාට අරමුණු වුනා. රූපයක් දැකීම කියන එක, ශබ්දයක් ඇසීම කියන එක අරමුණු වෙලා එයා බලන්නේ අර රූපයේ තොරතුරු බලනවා නෙවෙයි, ඒක ඒ අරමුණු වෙලා පහල වෙච්ච සිත පිළිබඳව යි බලන්නේ.

එතකොට අර මනසිකාරයේ දී තමයි ඒක වෙනස් වෙන්නේ. ආරම්මණයේ දී අපට අර කියපු ආයතන, කියන්නේ රූපය අරමුණු වෙන්න පුළුවන්. ශබ්දය, ගන්ධය, රසය, පොට්ඨබ්බය කොයි එකත් අරමුණු වශයෙන් එන්න පුළුවන්, චිත්තානුපස්සනාවෙදී. නමුත් හැබැයි, ඒ වෙලාවේ **එයා ඒ අරමුණේ එල්බිලා බලන්නේ හිත දිහාව මිසක්, රූපය දිහා නෙවෙයි**. ඒක තමයි වෙනස. බැලීමේ දී මනසිකාරයේ වෙනසත් එක්ක තමයි චිත්තානුපස්සනා, වේදනානුපස්සනා ආදී වශයෙන් නම් කරලා තියෙන්නේ.

එතකොට දැන් වේදනානුපස්සනාවේ නම් වේදනාව ම යි අරමුණු වෙන්නේ. නමුත් ඒකෙදී මුලින් රූපය අරමුණු වෙලා චක්ඛුසම්ඵස්සජා වේදනා, සෝතසම්ඵස්සජා වේදනා ආදී වශයෙන් මේවාත් එක්ක සම්බන්ධ වෙලා තමයි යෙදෙන්නේ. ඒ නිසා අර ඒ වෙලාවේ දී තියෙන්නේ ඇත්තට ම වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ තමයි. නමුත් රූපය ඇසුරු කර ගෙන තමයි ඒ දේවල් කාම ලෝකයේ පහල වෙන්නේ. එහෙම පහල වුනා කියලා ඒවා අරූපාවචර ධ්‍යාන හැටියට වත්, අරූපාවචර ධ්‍යානවලට ලඟයි කියලා වත්, කියන්නේ නැහැ, විදර්ශනා පැත්තෙන් ගත්තහම. මොකද, එයාගේ අරමුණ හැම වෙලාවේ ම මේ පරමාර්ථ ධර්මයන් විදර්ශනා කරන්න යි.

රූපාවචර ගත්තත් පළවෙනි ධ්‍යාන පළවෙනි අරූපාවචර සිත ගත්තහම සම්මුති අරමුණක්. ඒ නිසා ධ්‍යාන පැත්තකට යන්නේ නැහැ.

***... මහත්මිය (අපැහැදිලියි)*** :- තෙරුවන් සරණයි, ස්වාමීන් වහන්ස, දැන් අපි ආයතන වශයෙන් භාවනා කරන කොට යෝනිසෝමනසිකාරය කරන කොට, දැන් මරණ ධර්මතාවය කියන එක අවබෝධ වෙන, අපට දැන් හැම ආයතනයක ම ඒ විදියට එහෙම අවබෝධ වෙන ගතියක් තියෙනවා නේ ස්වාමීන් වහන්ස?

***ස්වාමීන් වහන්සේ***:- ඔව් ඔව්.

***ප්‍රශ්නකාරිය (අපැහැදිලියි)*** :- එතකොට දැන් එහෙම බැලුවහම දැන් බාහිර ආයතනය යි, අධ්‍යාත්මික ආයතනය යි, දෙකම අනිත්‍ය වනවා කියන යම් කිසි වැටැහීමක් එනවා නේ. දැන් එතැන ඊට පස්සේ බැලුවහම ස්පර්ශයෙන් හට ගන්න වේදනාව කියන එකට දැන් මට ඒක... , ඇත්තට ම මට ඒක අවබෝධ වෙන්න කයට සම්බන්ධ වෙලා භාවනා කරන කොට ඇතිවෙන්නේ අර ... වේදනාව තියෙන ... වේදනාව කියන එකත් අනිත්‍ය වන ධර්මතාවයක් ... තණ්හාවක් කියන එකත් ඇති කරන්න කොයි වෙලාවේ ... තණ්හා කියන එක පතිත වෙන්නේ කියන එක එහෙම දැන් තණ්හාව කියන එක අනිත් දෙපැත්තම අනිත්‍ය වන අරමුණු නම්, තණ්හාව කියන්නේ කොයි වෙලාවේ තණ්හාවක් ඇති කර ගන්න ද කියන මේ වගේ ... දැන් එතකොට ස්වාමීන් වහන්ස, සිතින් දැන් ඔය සීලබ්බත උපාදානය කියන එක එතැන දී අපි ට අමුතුවෙන් හිතන ආකාරයෙන් ... නැහැ. අත හැරෙනවා නේ ද ස්වාමීන් වහන්ස? ස්වාමීන් වහන්ස, එතකොට සීල ව්‍රතයකට

වැටෙන්නේ කට්ටිය එහෙම බලෙන් අත හැරෙන්නේ... දැන් ඒක නිවැරැදි ද ස්වාමීන් වහන්ස?

***ස්වාමීන් වහන්සේ***:- ඔව් දැන් සීලබ්බත පරාමාසයට වැටෙන එක එයාලා බලයෙන් මනසිකාරයෙන් අවිද්‍යාව දෘෂ්ඨිය නිසා කර ගන්න එකක්. නමුත් අතහැරීමේ දී එයා දැන් සක්කාය දිඨියත් එක්ක බැඳිලා තියෙන එක එතකොට යම් කිසි කෙනෙකුගේ මේ දර්ශනයෙන් මේ හේතු ඵල දහම දැකීම නිසා ගති ලක්‍ෂණය දැකීමත් එක්ක එයාට අමුතුවෙන් මේ සිලබ්බතපරාමාසය අයින් කරන්න කියලා අවශ්‍ය නැහැ. සීලබ්බතපරාමාසයවත් මේ ඒ උපාදාන ස්වභාවය. අර දිට්ඨිය අයින්වීමත් එක්ක ම සීලබ්බතපරාමාසය සහමුලින්ම නිරුද්ධ වෙලා යනවා. මොකද, ඒ දිට්ඨිය හා බැඳිලා තියෙන නිසා. දර්ශනය දකිනවාත් එක්ක ම එයා ස්වභාවයෙන් අයින් වෙලා යනවා.

***ප්‍රශ්නකරු***:- අමුතුවෙන් හිතලා අතහරින්න දෙයක් නැහැ.

***ස්වාමීන් වහන්සේ***:- අත හැරෙනවා. මාර්ගයත් එක්ක අත හැරෙනවා. නමුත් අපි දැන් මුලින් අපට ඕනෑ නම් අපි කියමුකො කෙනෙක් ඒ වාගේ තැනකින් ඉන්නවා නම් එයාට දැන් මෙක වැරැද්දක්, මේ සීලබ්බතපරාමාසය කියලා කියන්නේ මේ සාසනයේ එකක් නෙවෙයි කියලා, ඒ විදියට මෙනෙහි කරලා ඒ දෘෂ්ඨිය අයින් කර ගන්න උපකාරයක් වශයෙන් මනසිකාරය කරන්න පුළුවන්. ඒ දෘෂ්ඨිය යටපත් කර ගන්නවා. නමුත් ඒක සහමුලින් අත හැරෙන්නෙ දර්ශනයත් එක්ක යි. ලොකෝත්තර සෝවාන් මාර්ග දර්ශනයත් එක්ක ම අර දෘෂ්ඨිය අයින් වෙනවා. ඒ කියන්නේ, ඔය දෘෂ්ඨිය කවදාවත් විදර්ශනාවට පැමිණෙන කොට ම තියෙන්නේ නැහැ. මොකද, හරියට විදර්ශනාවේ මූලික කොටසේ ම ඔය සීලබ්බතපරාමාස දෘෂ්ඨිය අයින් වෙනවා. මොකද, ඒ එයාට දර්ශනය කියන එක එන කොට ම ඒක යටපත් වෙනවා, තදංග වශයෙන්. නමුත්

සහමුලින් ම අයින් වෙන්නේ මාර්ග සිතේ දී.

***ප්‍රශ්නකරු:***- එතකොට ස්වාමීන් වහන්ස, දැන් අපි පඤ්චඋපාදානස්කන්ධයේ උදය වැය බලන කොට දැන් ඔය විදියට එක එක ස්කන්ධ ධර්මතාවයන්ගෙන් අනිත්‍ය ප්‍රකට කර ගෙන බලන කොට විඤ්ඤාණයට පතිත වෙන්න, විඤ්ඤාණය පිහිටන්න ස්කන්ධ ධර්මතාවයක් නැහැ කියන එක අවබෝධයක් එනවා නේ ස්වාමීන් වහන්ස.

***ස්වාමීන් වහන්සේ:***- අන්න හරි ඔව්. ඒක තමයි අපට අවශ්‍ය වෙන්නේ.

***ප්‍රශ්නකරු:***- එතකොට ස්වාමීන් වහන්ස, එතැන දී දැන් අර විඤ්ඤාණය ඊළඟ සිතෙන් අරමුණු කරන්නේ අපි හැම වෙලේ ම, සම්පූර්ණයෙන් ම අනිත්‍ය වුණු ධර්මතාවයක සංඥාවක් ද?

***ස්වාමීන් වහන්සේ:***- පැහැදිලි වුනේ නැහැ මට ප්‍රශ්නය තව හරියට.

***ප්‍රශ්නකරු:***- ඒ කියන්නේ  ස්වාමීන් වහන්ස, අපි හිතමු දැන් අපට විඤ්ඤාණයට පතිත වෙන්න තැනක් නෑ කියන තැනක දැනුමක් එනවා නම්, එතැනින් පස්සේ ඒ කියන්නේ සේරම ධර්මතාවන් අනිත්‍ය වෙනවා කියන ස්කන්ධධර්මතා ටික අනිත්‍ය වෙනවා කියන එක නේ ... ඒ නාමරූපධර්මතාවය. එතකොට ඊට පස්සේ ඊළඟ සිතෙන් අපි අරමුණු කරන්නේ සේරම ධර්මතා ටිකක අනිත්‍ය වුනු තැන් අනිත්‍ය යි කියන සංඥාවක් ද ස්වාමීන් වහන්ස? අනිත්‍ය වූ ධර්මතාවක සංඥාවක් වගේ ...

***ස්වාමීන් වහන්සේ:***- ඔව්. ඒ නුවණ එයාට තියෙනවා. විදර්ශනා කරන කොට එයා දැන් ඇත්තට ම අපි පොදුවේ ගත්තහම හැම වෙලාවේ ම විදර්ශනා කරන ඒවා, නුවණ, අනුවණ, කොයි කාටත් මේ අරමුණු වෙලා තියෙන්නේ අනිත්‍ය දුක්ඛ අනාත්ම ධර්ම ටිකක් තමයි, එයා නො දන්නවා වුනාට. මොකද, අපට

අරමුණු වෙනවා නම් ඔය ත්‍රිලක්ෂණය දාලා බැලුවහම, අනිත්‍ය දුකඛ අනාත්ම කියන මේ අනිත්‍ය දුක්ඛ ලක්ෂණවලට අයිති නැත්තේ ලෝකෝත්තර නිවන විතර නේ. ඊට මෙහා ඔක්කෝ ම ඔය ලක්ෂණවලට අයිතියි.

ඒ නිසා අපි අරමුණු කරන්නේ ඇත්තට ම හැමදාම, දැන ගෙන හරි නො දැන ගෙන හරි, මේ වැඩකට නැති, අනිත්‍ය වූ අනාත්ම වූ දුක් වූ ධර්ම තමයි අරමුණු කරන්නේ. එතකොට ඒ විදියට දැන් අපි විදර්ශනා කරන කොටත් ඒකේ ඒ විදියට ම බලනවා. අපි නො දන්නා දේ නේ බලන්නේ. එහෙම බැලීමේ දී එයාට මේ ත්‍රිලක්ෂණය අවබෝධ වෙන්න, අවබෝධ වෙන්න එයාට අර අරමුණක් ප්‍රකට වෙන කොට ම මේක අනිත්‍ය ධර්මයක් නේ කියලා වැටැහෙනවා. සද්දයක් ඇහෙන කොට මේ සද්දය අනිත්‍ය දෙයක්. නිත්‍ය දෙයක් නෙවෙයි. අනාත්ම දෙයක් කියන නුවණ ඇතුළේ තියෙනවා එයාට.

දැන් අපට අර කැඩපතක් ඉස්සරහට ගියාම, ඒකේ අපි අමුතුවෙන් මෙනෙහි කරන්න අවශ්‍ය නැහැ නේ මේ තමන්ගේ ම ඡායාව. ඒක පැත්තකට යන කොට නැති වෙනවා කියලා අමුතුවෙන් හිතන්න දෙයක් නැහැ. ඒක අපේ ඇතුළත ම තියෙනවා. ඒ වගේ හොඳට විදර්ශනා ඥාන දියුණු කරලා දියුණු වෙච්චි කෙනාට එයාට ඇතුළතින් මේ අනිත්‍ය සංඥාව සිහි වෙනවා. ඉතින් නමුත් මේවා අර ආශ්‍රව බලවත් නිසා ඇතැම් ඇතැම් අරමුණුවල ඒ වගේ නිත්‍ය සංඥාව පිහිටන නිසා තමයි එයා නැවැත නැවැත, නැවත නැවත මේ අනිත්‍ය දුකඛ අනාත්ම වශයෙන් බල බල, බල බල ආශ්‍රව ගෙවමින් අර මාර්ග ඵලයක් උපදින තාක් කල් ඒ විදර්ශනා ඥාන උපදවා ගන්නේ.

***ප්‍රශ්නකරු:-*** ඒ කියන්නේ ඒක දිගට ම කරන තරමට තමයි ආශ්‍රව ගෙවෙන්නේ. නේ ද ස්වාමීන් වහන්ස?

***ස්වාමීන් වහන්සේ:-*** ඒකෙන් තමයි ආශ්‍රව ගෙවෙන්නේ.

නැත්නම් අර අපි දැන ගෙන හිටියාට, අර ආශ්‍රවය නිසා එක පාරම අර ඇති බවට, නිත්‍ය බවට, ආපසු මතු වෙලා එනවා හිතේ. ඒ නිසා ඒවා ගෙවෙන්නේ නැවත නැවත, නැවත නැවත ආයතන හය හරහා යම් තාක් උපදිනවා ද, උපදින උපදින හැම එකක් ම වගේ අනිත්‍ය වශයෙන් බලනවා නිත්‍ය වශයෙන් අහු වෙන්න නො දී. දුක් වශයෙන් බලනවා සැප වශයෙන් අහු වෙන්න නො දී. එතකොට සිත ක්‍රමානුකූල අනික් පැත්තට හැරෙනවා.

***විශාඛා විදානපතිරණ මහත්මිය***:- තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස, මට දැන් අර හුඟක් හරිය කතා කලේ කුසලමූලපච්චයා විඤ්ඤාණං කියන එක නේ. ඒකේ ඔබ වහන්සේ දේශනා කලා නේ  මේ සංඛාරපච්චයා විඤ්ඤාණං කියලාත් එකක්. ඒක ඒ මොන සංඛාරය ද ස්වාමීන් වහන්ස? එතකොට එතැන සංඛාර කියලා ගන්නේ, දැන් අර අවිද්‍යාවෙන් එන සංඛාර නෙවෙයි නේ එතැන? එතැන යෙදෙන සංඛාරය ගැන පොඩ්ඩක් විස්තර කරනවා ද ස්වාමීන් වහන්ස?

***ස්වාමීන් වහන්සේ***:- ඔව් එතැන අපි හැඳින්වූවේ දැන් ක්‍රියා සිතක හා විපාක සිත්වල. විපාක සිත් කියන්නෙත් කුසල් නෙවෙයි නේ. එතකොට කර්ම සිත් තමයි කුසල් අකුසල් වෙන්නේ. එතකොට විපාක ගැන අපි කතා කරන කොට ඒවා **කුසලමූලපච්චයා** කියලා පටන් ගන්න  බැහැ. මොකද ඒක ඒ කුසලයට අනුරූපව ලැබෙන විපාකයක් නිසා. **සංඛාරපච්චයා විඤ්ඤාණං** කියලා පටන් ගන්න කොට ඒ සංඛාරය කියලා කියන්නේ ඒ වෙලාවේ ඒ හිතේ තිබෙන චේතනාව යි. දැන් අපට උපදින කොට හැම වෙලාවේ ම කොයි සිතක් ඉපදුනත් මේ චේතනාවක් නැතුව උපදින්නේ නැහැ නේ. එතකොට දැන්

අපි කියමු පෙර කර්මයක් කරලා ඒ කර්මයට අනුව, අපි කියමුකො උදාහරණයක් වශයෙන් ඔන්න පළවෙනි කුසල් සිත අපට සිද්ධවෙනවා. **කුසලමූලපච්චයා** කියලා ඤාණසම්පයුක්ත වූ සසංකාරික හෝ අසංකාරික හෝ කාමාවචර කුසල් සිතක් හටගත්තහම, ඔන්න කුසල කර්මයක් වෙනවා. ඒ කර්මය ක්‍රමානුකූලව පැසීමට ගිහිල්ලා විපාකයක් වශයෙන් එන කොට, අපට හැම වෙලාවේ ම විපාකය දෙන්න නම් ඒ විපාකයට අදාළ සුදුසු පරිසරය සැකැසිලා අනිවාර්යයෙන් ම සංඛාරයක් වෙන්න ම ඕන. ඒ සංඛාරයත් මනසිකාරයත් ඒ සිතේ චේතනාව තමයි එතැන **සංඛාරපච්චයා** කියලා කියන්නේ. අපි චක්ඛුවිඤ්ඤාණයේ සිතක් ගත්තත් සංඛාරයක් තියෙනවා නේ.

දැන් අපට රූප ශබ්ද ආදී මේ දේවල් විපාක වුනාට කවදාවත් ඒ රූප බැලීමේ චේතනාව නො තිබුණා නම්, ඒ සංඛාරය නො තිබුණා නම් ඇසේ රූප ගැටුණා කියලා ඒ සිත පහල වෙන්නේ නැහැ. ශබ්ද කොච්චර ඇහුනත් ඒ ශබ්ද ඇසීමේ චේතනාව නො තිබුණා නම් ඒ ශබ්දය අපට ඇහෙන්නේ නැහැ. අන්න ඒ වාගේ තමයි. හැම සිතක් ම උපදින්න සංඛාරයක්, චේතනාවක් අවශ්‍ය යි.

එතකොට මෙතැන **සංඛාරපච්චයා විඤ්ඤාණං** කියන කොට ඒ සිතේ තියෙන චේතනාව තමයි සංඛාරස්කන්ධය හෙවත් සංඛාරය හැටියට ඒ පටිච්චසමුප්පාදයේ හඳුන්වලා තියෙන්නේ. තෙරුවන් සරණයි.

***බණ්ඩාර මහතා (අපැහැදිලියි):-*** ස්වාමීන් වහන්ස, මේ දේශනාවේ සඳහන් වුනා නේ අරූපී බ්‍රහ්ම ලෝකයේ මනායතන, ධම්මායතන දෙක තියෙනවා. රූපී බ්‍රහ්ම ලෝකයේ

අර අසඤ්ඤ තලය ගත්තහම රූපාවචර ... සඳහන් වුනා නේ ද?

***ස්වාමීන් වහන්සේ*** :- ඔව් ඔව්.

***ප්‍රශ්නකරු***:- එතකොට එතැන ස්වාමීන් වහන්ස, ධම්මායතන වශයෙන් ගන්නේ දැන් අර ...ද?

***ස්වාමීන් වහන්සේ***:- ඔව් ඔව් ඒ ටික තමයි ජීවිත නවකයත් එක්ක තියෙනවා නේ. එතකොට ඒ අදාළ රූපායතනය හැරුනහම අනිත් ඔක්කෝම ධම්මායතනයට තමයි අයිති වෙන්නේ.

***ප්‍රශ්නකරු (අපැහැදිලියි)*** :- ස්වාමීන් වහන්ස, තව ප්‍රශ්නයක් තියෙනවා. දැන් අර ... උත්පත්තිය ලබන සත්ත්වයා ... භවයේ ... වශයෙන් ගත්තු ඒ කර්ම ... මොකද, ...නේ ද

***ස්වාමීන් වහන්සේ***:- ඔව් ඔව්.

***ප්‍රශ්නකරු (අපැහැදිලියි)*** :- එතකොට ... ස්වාමීන් වහන්ස, ... එයාට දැන් මේ චිත්ත නියාමය අනුව චුතියට අනතුරුව ප්‍රතිසන්ධි සිතක් නේ හට ගන්නේ. එතකොට එතැන කර්ම සිතක් පහල වෙන්න ඕනේ. එතකොට එයාට ඒ කර්ම සිත හට ගන්න කර්මයක් හට ගන්න පෙර ... යම්කිසි කාරණාවක් ඉදිරිපත් වෙන්න ඕන නේ ද?

***ස්වාමීන් වහන්සේ*** :- ඔව් ඔව්.

***ප්‍රශ්නකරු (අපැහැදිලියි)*** :- විශේෂයෙන් අපි දැන් මේ ... සත්ත්වයෙක් නිසා එයාට මේ සතර අපායේ උත්පත්තියක් ලබන්න හේතුවක් තියෙනවා ද?

***ස්වාමීන් වහන්සේ***:- නෑ මොකද මේ ඒකේ දී ඒකට හේතුව තමයි, දැන් අසඤ්ඤ තලයේ යන කෙනා සාමාන්‍ය කෙනෙකුත් නෙවෙයි. චතුර්ථධ්‍යානය දක්වා සිත දියුණු කරලා

අකුසලයන් නීවරණයන් ඉතාමත් බලවත් ලෙස යටපත් කරපු කෙනෙක් තමයි. එයාගේ දෘෂ්ඨිය නිසා යි අසඤ්ඤ තලයට යන්නේ. ඉතින් ඒ නිසා බොහෝ කාලයක්, කල්ප පන්සියයක් ම මේ අසඤ්ඤ තලයේ ආයුෂ තියෙන නිසා, ඒ බොහෝ කාලයක් ඒ විදියට කෙලෙස් යටපත් කරලා තිබුණු නිසා ඒ කර්ම ශක්තියේ බලය නිසා තමයි ඒ සිත් පහළ නො වී තිබුණේ. කර්ම ශක්තිය ගෙවිච්ච ගමන් ම ධර්මතාවයක් වශයෙන් හිත් පහළ වෙනවා.

එතකොට හිත් පහළ වෙන කොට හැම වෙලාවේ ම ඒ අර කරපු බලවත් කර්මයන් තමයි ඉදිරිපත් වෙන්නේ. ඒ නිසා බොහෝ කාලයක් ඒ දේවල් නීවරණ යටපත් කරලා තිබුණ නිසා, අනික පඤ්චමධ්‍යානය දක්වා දියුණු කරලා එතැනට පැමිණි නිසා අනිවාර්යයෙන් එයාට ඒ මරණාසන්න මොහොතේ කුසල් සිතක් තමයි පහළ වෙන්නේ. එතකොට මනුස්ස ලෝකයේ, දිව්‍ය ලෝකයේ තැනක ඉපදිලා පසුව යන්න පුළුවන් සතර අපායට.

***ප්‍රශ්නකරු:***- ස්වාමීන් වහන්ස, දැන් ... ගිය භවයේ යම්කිසි සිතකින් නම් අරගත්තේ ඒ සිතත් ප්‍රතිසන්ධි වශයෙන් හට ගන්නවා ද කියලා මම මේ ...

***ස්වාමීන් වහන්සේ:***- ඔව් ඔව්.

***ප්‍රශ්නකරු:***- හරි තේරුණා ස්වාමීන් වහන්ස.

***ජයන්ත මහතා:***- ප්‍රශ්නයකටත් වඩා ආනන්ද මහත්මයා සමා වෙන්න ඕන මම මේ වාහනයක් පදවමින් සිටපු නිසා මට ස්වාමීන් වහන්සේට ආරාධනා කරන්න නොහැකි තත්ත්වයක්

තිබුණා. ඒ ගැන මම ප්‍රථමයෙන් ම සමාව අයදිනවා. ස්වාමීන් වහන්ස, මේ සවනට සිසිලස වෙනුවෙන්. ඒ වාගේ ම ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ බොහෝම හොඳට කරුණු පැහැදිලි කරලා දුන්නා, විශේෂයෙන් ම මේ ධම්මහදය විභඞ්ගයේ තිබෙන වැදගත්කම. ස්වාමීන් වහන්ස, ඒක වුනත් මම හුඟක් අහලා තියෙනවා ඇතැම් දේශනාවල දී අපරියාපන්න භූමිය කියන එක වැරදි විදියට අර්ථකථනයක් කිරීම නිසා, ඒ අපරියාපන්න භූමිය කියන එක රහතන්වහන්සේ කියන නමින් ප්‍රතිස්ථාපනය කරලා. ඒ කියන්නේ රහතන් වහන්සේට තමයි අපරියාපන්න භූමිය කියලා කියන්නේ කියලා වගේ. එහෙම කිව්වහම සියලු දේ ම පැටලෙනවා. ... ඇතැම් විට අහලත් ඇති. ඒකට කියනවා එතැන දී අර අපරියාපන්න භූමියෙහි දී ආහාර වර්ග තුන යි. ඵස්සාහාරය යි, මනෝසඤ්චේතනාහාරය යි, විඤ්ඤාණාහාරය යි කියන තැන දී එතැන කබලිංකාරාහාරය අයිති වෙන්නේ නැත්තේ එතැන නාම ධර්ම ගැන මාර්ග සිත්, ඵල සිත්, සහ ඒ චෛතසික ධර්ම සහ නිර්වාණය කියන එක ගැන පමණක් කතා කරන හින්දා එතැන දී ඒ නාමධර්මවලට කබලිංකාරාහාරය අයිති වෙන්නේ නැති නිසා යි එතැන කබලිංකාරාහාරය නැත්තේ. එතකොට දැන් කෙනෙක් කියනවා නම් දැන් මේක බලලා රහතන් වහන්සේට කබලිංකාරාහාරය අදාල වෙන්නේ නැහැ කිව්වොත් ඒක ලොකුම ...

***ස්වාමීන් වහන්සේ*** :- ඔව්.

***ප්‍රශ්නකරු:***- ඒ වාගේ ... අපට ඇත්තට ම ඇහිලාත් තියෙනවා. ඉතින් ඒක නිසා, අනිත් එක ආයතන දෙකයි කියලා කියනවා. අපරියාපන්නයේ ආයතන දෙකයි කියන කොට මනායතන ධම්මායතන කියන කොටත් ස්වාමීන් වහන්ස, ඒවා අනිත් ආයතන නැහැයි කියනවා රහතන්වහන්සේට. ඒ වාගේ මේ විදියට අපරියාපන්න භූමිය කියන එක තේරුම් ගත්තහම

ලොකු පටලැවිල්ලක පැටලිලා අනික් අයවත් පැටලෙන ගතියක් තියෙනවා ස්වාමීන් වහන්ස. මම හිතනවා ඒක මතු කරන්න සුදුසු යි කියලා මේ වාගේ තැනක දී, ස්වාමීන් වහන්ස.

***ස්වාමීන් වහන්සේ:-*** ඔව් ඇත්තට ම මේ රහතන්වහන්සේ පිළිබඳව විවිධ කතා ප්‍රවෘත්ති අද තියෙනවා. ඉතින් ඒ නිසා ඇතැම් විට මේ රහතන් වහන්සේට හැම මොහොතේ ම ලෝකෝත්තර සිත් පහල වෙනවා කියනවා. ඒ වාගේ ම රහතන්වහන්සේට හැම වෙලාවේ ම ක්‍රියා සිත් පහල වෙන්නේ නැහැ කියන දේවල්. අර කියපු ගොඩක් එක එක කතා වැරැදි කතාවල් මේ දේශනා තුළ අපටත් අහන්න ලැබිලා තියෙනවා.

ඉතින් ඒ නිසා රහතන්වහන්සේ අපි කියලා කියන්නේ ඒ අහීත් ඵල, මාගී ඵල සිත් දෙක ගත්තහම අපි මේ රහතන්වහන්සේ කියලා හඳුන්වනවා. එතකොට අහීත් ඵල, එතකොට නමුත් අපි පොදුවේ සම්මුතියේ තියෙන්නේ රහතන් වහන්සේ කියන එක සාමාන්‍ය පුද්ගලයෙක්. එයාට කාම ලෝකයේ නම්, කාම ලෝකයේ ඉන්න කොට එයාට මේ ස්කන්ධ පහ ම තියෙනවා. ඊට පස්සේ විපාක සිත් පහල වෙන්න පුළුවන්. ආයතන හය ම තියෙනවා. මේ ඇහෙන් රූප බලනවා. ශබ්ද අහනවා. එතකොට මේ කාම ලෝකයේ නම් ආයතන දොළහ ම රහතන්වහන්සේට ක්‍රියාත්මක වෙනවා.

නමුත් ඒ වෙනස තියෙන්නේ, රහතන්වහන්සේලාට ඒ ආයතන හරහා අකුසල් උපදින්නේ නැහැ. කුසල් උපදින්නේ ත් නැහැ. ඒ වෙනුවට ක්‍රියා සිත් ඉපදීම තමයි රහතන්වහන්සේ. ඒකයි මේ, ක්‍රියා සිත් රහතන්වහන්සේට උපදිනවා කියලා සඳහන් වෙලා නැහැ.

නමුත් ඇත්තට ම ඒ පට්ඨානය ගත්තහම ප්‍රත්‍ය පෙන්නන කොට ඒවාගේ විතරක් ඉතාමත් අඩු තැන්වල **අරහා ක්‍රියා චිත්තං උප්පාදෙති** කියලා විතරක් බොහෝම සුලු තැන්වල

පෙන්නනවා. ඊට මෙහා කිසි තැනක මේ අව්‍යාකෘත සිත් හැටියට පෙන්නනවා මිසක් පුද්ගලභාවයක් සඳහන් කරලා පෙන්නන්නේ නැහැ. ඉතින් ඒ නිසා ඒ ක්‍රියා සිත් හැම වෙලාවේ ම ස්වභාවය ගත්තහම ඒවා වෙන කිසි ම සත්ත්වයෙකුට පහල වෙන්න බැහැ. වෙන සත්ත්වයෙකුට පහල වෙනවා නම් එක්කෝ කුසල් සිත්. එහෙම නැත්නම් අකුසල් සිත්. එහෙම නැතිනම් විපාක සිත්. ක්‍රියා අහේතුක සිත් දෙකක් පහල වෙන්න පුළුවන්. එච්චර යි. සහේතුක ක්‍රියා සිත් කිසිවක් පෘතග්ජන කෙනෙකුට හෝ වෙන මාර්ග ඵල ලාභී රහතන්වහන්සේ හැර වෙන මාර්ග ඵල භික්ෂූන් වහන්සේ නමකට පහල වෙන්නේ නැහැ. ඉතින් ඒ නිසා මේ, ඒ කාමාවචර ලෝකයේ ඉන්න කොට ඒ රහතන්වහන්සේලාගේ ආයතන ස්කන්ධ ධාතු මේ සියල්ල තියෙනවා.

නමුත් මේ ඒ අරිහත් ඵල සිත විස්තර කරන කොට, අරිහත් මාර්ග සිත විස්තර කරන කොට අපි ඒකට අදාලව විතරක් ඒ ධර්ම කියන්නට ඕන. ලෝකොත්තර ධර්මයෝ කියලා ගත්තහම, ඒ මාර්ග ඵල සිත් ටිකට අදාලව කියන්න ඕන. එහෙම කිව්වාට උන්වහන්සේට එදිනෙදා හැම මොහොතේ ම ලෝකෝත්තර සිත් උපදිනවා නෙවෙයි. ඉතින් ඒ නිසා ඒවා අපි නිවැරැදිව තේරුම් ගන්න ඕන.

ඉතින් ඒ **ධම්මහදය විභංගයේ** කියන කාරනා නිවැරැදි, ඒ කාරනා නිවැරැදිව තේරුම් ගැනිම හා ඒවා නුවණින් විමසලා බැලුවොත් මේවා කොහොම ද වෙන්නේ. මෙහෙම වෙන්න පුළුවන් ද? දැන් රහතන්වහන්සේ නමකට රූප පෙනෙන්නේ නැද්ද? ආයතන දෙක යි නම් එතකොට උන්වහන්සේට මේ චක්ඛායතනය යි රූපායතනය යි චක්ඛු විඤ්ඤාණය යි කියන මේ සිත් උපදින්නේ නැද්ද? කියලා හොඳට විමසලා බලන්න ඕන.

විමසලා බලන කොට කෙනෙක් නුවණින් හිතනවා නම් ඔය

කියන දේවල්වල මොනවා හරි ගැටලු ප්‍රශ්න තියෙනවා කියන එක කෙනෙකුට ප්‍රශ්නයක් වශයෙන් ඉදිරිපත් වෙන්න ඕන. ඒ නිසා ඒවා ඇත්තට ම  බලලා තේරුම් අර ගෙන නිවැරැදි ධර්මය ඉගෙන ගන්න කියලා මම ආරාධනා කරනවා, මේ ධර්මය බොහෝ කාලයක් පැවැත්වීම සඳහා. තෙරුවන් සරණ යි.

***ප්‍රශ්නයක්:-*** ස්වාමීන් වහන්ස, තව පොඩි ප්‍රශ්නයක් මතු වුනා මේක ඇත්තට ම ධර්මයට, ඒ සාකච්ඡාවට කෙලින් ම සම්බන්ධ නැති වෙන්න පුළුවන් ස්වාමීන් වහන්ස. දැන් අර වසල කතාවක් ඔබ වහන්සේ මතක් කර ගත්තා නේ ස්වාමීන් වහන්ස, අර ... එනවයි කියලා. පිළින්දිවච්ච මහරහතන්වහන්සේගේ. ස්වාමීනි, දැන් ඒක අපට තේරෙන හැටියට එක් අවස්ථාවක දී එක දෙයක් වගේ ද? එහෙම නැත්නම් එය නිතරම සිද්ධ වුනා ද ඒ විදියේ කථාව? ඒකට බුදුන් වහන්සේගේ යම්කිසි අවවාදයකින් හෝ පසුව එය වෙනස් වුනා ද? ... වගේ කරුණු සඳහන් වුනොත් ස්වාමීන් වහන්ස,

***ස්වාමීන් වහන්සේ:-*** මට එහෙම දැන් එක වරම සිදුවුනේ කියන එකක් අපට ගන්න බැහැ. අරක විශේෂ අවස්ථාවක් නිසා එතැන පෙන්නලා තියෙනවා. නමුත් පුරුද්දක් වශයෙන් ඒ වසල වාදයෙන් කතා කරන බව තමයි සඳහන් වෙලා තියෙන්නේ. නිතරම කතා කරනවා නෙවෙයි. ඇතැම් වෙලාවට උන්වහන්සේගෙන් ඒ වගේ අර සසර පුරුද්ද නිසා එබඳු දේවල් පිටවෙන්න පුළුවන් කම නිසා වෙන අවස්ථාවල එහෙම කතා කරලා උන්වහන්සේ ඇති. නමුත් ඉතින් අර සසර පුරුදු නිසා මිසක් ඒවා කෙලෙසයක් නොවන නිසා, අනික ඒවා අපි කල්පනා කරලා හිතලා කරන දේවල් නොවන නිසා, ඒකට

බුදුරජාණන් වහන්සේ වත් වාරණ පනවන්න යන්නේ නැහැ. නමුත් ඒ සසර ස්වභාවය විතරක් බුදුරජාණන් වහන්සේ පැහැදිලි කරනවා. ඒ භික්ෂුව කෙරෙහි කෙලේසයක් අමනාපයක් අකැමැත්තක් කෙලේසයක් ඇති කර ගන්න එපා. උන්වහන්සේ සියලු කෙලෙස් නසලයි. උන්වහන්සේ ද මේ ද්වේෂයෙන් කතා කරනවා නෙවෙයි. සසර මෙන්න මේ කාලයේ මෙච්චර කාලයක් මේ විදියට ඉපදිලා තිබුණු නිසා තමයි උන්වහන්සේගෙන් මේ විදියට වචන පිටවෙන්නේ කියලා, ධර්මතාවය පැහැදිලි කරලා දෙනවා මිසක් ආයෙ ආපත්ති පනවන්න හෝ වාරන පනවන්න යන්නේ නැහැ. මොකද හේතුව, ඒ දේවල් ස්වභාවයෙන් අර සසර පුරුද්ද කියන එක නිසා එන නිසා.

***ප්‍රශ්නකරු:-*** මට මේක මේ විදියට අහන්න හිතුණේ ස්වාමීන් වහන්ස, දැන් වර්තමානයේ අපි දකිනවා විවිධ රටා ඉදිරිපත් කරමින්, ඒ කියන්නේ මේ පිළින්දිවච්ච රහතන්වහන්සේ මෙහෙම කතා කරන්න පුළුවන්. ඕන කෙනෙකුට ඕන විදියකට කතා කරන්න පුළුවන් කියලා ම, ... සංවරයක් නැතුව කතා කරන අවස්ථාවල් අපට ගොඩක් දකින්න ලැබෙනවා. ඒකට සමහරක් අය උපයෝගී කරන්නෙත් මේකම යි. මේ පිළින්දිවච්ච මහරහතන්වහන්සේ ම යි. නමුත් අපි රහතන්වහන්සේලා වුනත් කවුරු වුනත් ස්වාමීන් වහන්ස, අපි සංවර වෙන්න ඕනයි කියන එක අපට හැකියාවක් තියෙනවා කල යුතු බව අපි දැනගන්න ඕන නේ ද ස්වාමීන් වහන්ස?

***ස්වාමීන් වහන්සේ:-*** අනිවාර්යයෙන් ම ඒක තමයි. ඒක ඉතින් අනිවාර්යයයි. ඒකෙන් බොහෝ විට අර ඒ මහරහතන්වහන්සේලාගෙන් නැතත්, කලාතුරකින් අර ඥාණවිප්පයුත්ත සිත් පහල වීම නිසා වෙනවා මිසක්, නමුත් ඒවා නිතර නිතර ඒ දේවල් පුරුද්දක් වශයෙන් නිතර කරන්නේ නැහැ උන්වහන්සේලා. මොකද, හැම වෙලාවේ ම බුදුරජාණන්

වහන්සේ දේශනා කරලා හැම වෙලාවේ ම රහතන්වහන්සේටත් මේ විනය ශික්ෂා අයිති යි. නො පැහැදුණු අයගේ පැහැදීම පිණිසත්, පැහැදුණු අයගේ වඩා පැහැදීම පිණිසත් භික්ෂුවක් විසින් කටයුතු කළ යුතු යි කියන එක අනිවාර්‍ය්‍ය විනය කාරණාවක්. ඉතින් ඒ නිසා අපි හැම වෙලාවේ ම එතැන දී කෙනෙක් අපැහැදීමට හේතු වෙනවා නම් ඒ පෘතග්ජන කෙනෙක් වුනත් අපි එතැන දී සංවර විය යුතු යි. ඒක අත්‍යවශ්‍ය දේවල්.

තෙරුවන් සරණ යි.

“**ධම්මහදය විභංගයේ** කියන, ඒ කාරනා නිවැරැදිව තේරුම් ගැනිම හා ඒවා නුවණින් විමසලා බැලුවොත් මේවා කොහොම ද වෙන්නේ. මෙහෙම වෙන්න පුළුවන් ද? දැන් රහතන්වහන්සේ නමකට රූප පෙනෙන්නේ නැද්ද? ආයතන දෙක යි නම් එතකොට උන්වහන්සේට මේ චක්ඛායතනය යි රූපායතනය යි චක්ඛු විඤ්ඤාණය යි කියන මේ සිත් උපදින්නේ නැද්ද? කියලා හොඳට විමසලා බලන්න ඕන. විමසලා බලන කොට කෙනෙක් නුවණින් හිතනවා නම් ඔය කියන දේවල්වල මොනවා හරි ගැටලු ප්‍රශ්න තියෙනවා කියන එක කෙනෙකුට ප්‍රශ්නයක් වශයෙන් ඉදිරිපත් වෙන්න ඕන. ඒ නිසා ඒවා ඇත්තට ම බලලා තේරුම් අරගෙන නිවැරැදි ධර්මය ඉගෙන ගන්න කියලා මම ආරාධනා කරනවා, මේ ධර්මය බොහෝ කාලයක් පැවැත්වීම සඳහා.